සයුරෙන්

# එතෙර

එතෙර ශ්‍රමයට මෙතෙර උපහාරය

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී.
ISSN 1391 5145
2020 දෙසැම්බර්

ඔබ සැමට
ශුභ
නත්තලක්
වේවා !



# සාමය ගෙනෙන නත්තල

**සෑම වසරකම දෙසැම්බර් මාසය ප්‍රධාන වන්නේ දෙසැම්බර් 25 ට යෙදෙන නත්තල වෙනුවෙනි. නත්තල මූලික වන්නේ කතෝලික ආගම වෙනුවෙනි. ක්‍රිස්තියානි භක්තිකයින් ඉතා ආශාවෙන් ආදරයෙන් ගෞරවයෙන් වැළඳ ගන්නා ආගමික උත්සවයක් බවට නත්තල පත්වෙයි. නත්තල ආගමික උළෙලක් වුවද පොදු මහජනයාද අද එය උත්සව ස්වභාවයකට පරිවර්ථනය කරගෙන ඇත.**

විශේෂයෙන් නත්තල් අසිරිය වඩාත් ප්‍රබලව නැගී එන්නේ කතෝලික ජනයා වෙසෙන ප්‍රදේශවලය. කතෝලික බහුතරය සිටින බටහිර ප්‍රමුඛ රටවල මේ තත්වය වඩාත් ඉහළින් දැකිය හැක. යේසුස් වහන්සේගේ උපත නත්තල් දා සිදුවූ බවට යම් යම් අය මතවාද ඉදිරිපත් කළද එහි සත්‍යයක් නැත. එය කතෝලික ප්‍රජාව විසින් ද පිළිගන්නා කරුණකි. එවැන්නක් බයිබලය තුළද සඳහන් වන්නේ නැත.

යේසුස් වහන්සේගේ උපත හා මරණය වෙනත් කාරණයකි. නත්තල හෝ දෙසැම්බර් 25 යනු තවත් කාරණයකි. ඉතිහාසයේදී කවර හෝ කරුණක් හේතුවෙන් කතෝලික ජනයා විසින් දෙසැම්බර් 25 සිය ආගම මුල්කරගෙන උත්සව දිනයක් ඇරැඹිය. එය නත්තල බවට නම්වෙයි. ක්‍රිස්තියානි භක්තිකයින් විසින් මේ දිනය යේසුස් වහන්සේත් ක්‍රිස්තුස් වහන්සේත් ක්‍රිස්තියානි ධර්මයත් ඇදහීම මූලික කරගනිමින් ඔවුන්ගේ සංස්කෘතික බැඳීමද යාවත්කාලීන කරගැනීම සඳහා යොදා ගෙන ඇත. එය මහා හර පද්ධතියක් සමඟ ගොඩනගා ගෙන ඇත. එක් අතකින් ආගමික ප්‍රමුඛතාවත් සංස්කෘතික සබැඳියාවත් ගොඩ නගයි. ඔවුන්ගේ යාළු මිත්‍රකම් ද නෑදෑ හිතවත්කම් ද අලුත් කරයි. එයින් ඇති වන්නේ සංස්කෘතික සබැදියාවයි.

සෑම ආගමක් නිසාම බැදුනු සංස්කෘතික පදනමක් ද ඇත. හිංදු වේවා ඉස්ලාම් වේවා බෞද්ධ වේවා මෙම ආගම් හා දර්ශනයන් මූලික කරගත් සංස්කෘතික බැඳීමක් පවතී. ඒ ඒ සමයන්වල පවතින ආගමික උළෙලත් සමඟ එම සංස්කෘතික සබැදියාවද ශක්තිමත් වෙයි.

කතෝලික ජනයාට ආගමික හා සංස්කෘතික වශයෙන් නත්තල සුවිශේෂී වන්නේ කතෝලික ආගමට හා බැඳුනු වෙතත් ප්‍රබල ආගමික සිද්ධීන් හා බැදුනු වෙනත් දින අඩු බැවිනි. නමුත් ඔවුන්ගේ දේව මෙහෙයන් මංගල්‍යයන් ඒ ඒ නිකායන් හා ආගමික ස්ථාන පසුබිම් කරගෙන තිබුණත් ඒවා සංස්කෘතිකමය වශයෙන් දැඩිව බැදී නැත.



වර්තමානය වන විට මිනිස් සිතුම් පැතුම් ආධ්‍යාත්මික ගුණ වගාවෙන් පරිහානියට පත්ව ඇත. එය සියලු ආගමිකයින් හා ජාතීන්ට පොදුවී ඇත. සෑම තැනකම ආදරය ප්‍රේමය මෛත්‍රිය කරුණාව පරාර්ථය සමාජයෙන් සීඝ්‍රලෙස පරිහානියට ලක්වෙයි. එය කතෝලිකයින්ට කියා වෙනසක් නැත. ඒක ලෝක ප්‍රවනතාව බවට පත්වී තිබේ. කුමන වර්ගයා වුණත් කුමන ජාතිය වුණත් කුමන රට වුවත් ඉන් සිදුවන්නේ විනාශයකි.

නත්තල සිහි ගැන්වෙන විට මත්පැන් නිෂ්පාදනය ඉහළ යන අතර ඌරන් කුකුළන් එළුවන් බැටළුවන් ආදී අහිංසක සතුන් ගේ ජීවිත ඉරණම තීන්දුවෙයි. මෙම කාලයට පරපණ විශාල



වශයෙන් විනාශ කරයි. මෙය හොඳ තත්ත්වයක් යැයි කාට කිව හැකිද? කුමන ආගම වුවත් කුමන ජාතිය වුවත් කුමන ආගම් නායකයා විසින්වත් අනුමත නොකරන අතර එසේ අනුමත කරන්නේ නම් එය මනෝභාවය පිළිබඳ ප්‍රශ්නයකි.

ආගමික ක්‍රියාවලියක් මූලික කරගත් කාර්යක් තුළින් සත්ව හිංසාව සිදුවන්නේ නම් එය ආගමටත් නින්දාවක් නොවන්නේද? සියලු ප්‍රාණීන් සිය ප්‍රාණයට ආදරය කරයි. මරණය කිසි විටකත් අනුමත නොකරන්නකි. මරණය අනුමත නොකරනවා නම් මැරීම මරාදැමීම කෙසේවත් අනුමත කළ නොහැක. අගම විසින් මිනිසාගේ අධ්‍යාත්මික හික්මීම විමුක්තිය පරළොව සුගතිය සඳහා යොමු කරයි. පරළොව සුගතිය සඳහා මෙළොවද කළ යුතු කාර්ය භාරයක් ඇත. දෙවියන් ලගට යෑම සඳහා මෙළොවද දෙවියෙකු සේ කටයුතු කළ යුතුය. දෙවියෙකුට කෙසේ වත් කළ නොහැක. දෙවියන් නොසලකා කටයුතු කරන යම් අයෙක් ඇද්ද ඔහු යක්ෂයා ඇසුරු කරන්නෙකි. දෙවියන් ඇසුරු කරන දෙවියන් ලඟට යෑමට බලාපොරොත්තු වන අයෙක් යක්ෂයෙකු සේ එළුවෙකු ගේ කුකුළෙකුගේ ගවයෙකු ගේ බැටළුවෙකුගේ බෙල්ල කපන්නේ කෙසේද? එසේ වුවහොත් ඔහු හෝ ඇය යන්නේ දෙවියන් ලඟටද යක්ෂයා ලගටද යන්න තම තමා විසින්ම සිතා මතා තේරුම් ගත යුතුව ඇත. සිහිය විකල් කරන මත්පැන් පානය කිරීමෙන් මිනිසා දෙවියන් ලගට යන්නේද යක්ෂයා ලඟට යන්නේද යන්න නත්තල් උත්සවයට මත්පැන් එක්කල කතෝලික ප්‍රජාව විසින්ම පිළිතුරු සැපයිය යුත්තකි. කතෝලික උත්සවයක් වූ නත්තල සැමරීමට සත්ව ජීවිත විනාශ කිරීමට අනුබල දුන් කතෝලික සංස්කෘතිය ඒ ආගමට බද්ධ වන්නේ කෙසේද කියා වර්තමාන කතෝලික ප්‍රජාව දෙවරක් සිතා බැලිය යුතුය.

**දරුවන්ට සතුටත් ගුණ ධර්මත් ලගාකර දීමට වැඩි හිටියන් නත්තල යොදා ගන්නේ නම් නත්තලේ අගය තවත් වැඩි වනු ඇත. එය එසේ කිරීමට වැඩිහිටියන් නුවණින් යුතුව කටයුතු කළ යුතුය.**

පුරාණයේ මිනිසා උපතින් ආගමික ලබ්දියෙකු වූයේ නැත. ඔහු තම කල වයසත් සමඟ දැනුම හා අවබෝධය අනුව තමාට හරි යැයි සිතෙන දහමකට හෝ ආගමකට හෝ ලබ්ධියකට එක් වූහ. එහෙත් වර්තමානය වන විට තමාගේ කිසිදු අනු දැනුමකින් තොරව දෙමාපියන් විසින් තමාට ආගමක් දහමක් බලෙන් පටවයි. මේ තත්ත්වය සැම ආගමකට ජාතියකට දක්නට ලැබෙන්නකි. නමුත් එසේ බලෙන් ඒ ඒ ආගමට දහමට බද්ධකළත් ජන්මියා තුළ එවැනි ආගමික ලැදියාවක් නැත. එහෙත් සමාජය මගින් බලෙන් පටවා ඇති ආගමක සිරකරුවෙකු වන මොහු එම දහම හුවා දක්වමින් ඊට ප්‍රතිවිරුද්ධ ක්‍රියා කරයි. එයින් එම ආගම් වලට හා ඒ ඒ ධර්මයන්ට සිදුවන හානිය අති මහත්ය.

කෙසේ නමුත් නත්තල කුඩා දරුවාගේ සිට වැඩිමල් මහල්ලා දක්වා සිතට සතුට ගෙන දෙන උත්සව සමයකි. නත්තල වෙනුවෙන් සැරසිලි උත්සව ආදියෙන් අනූනය තෑගි බෝග කොයිකාටත්



හුවමාරු වෙයි. විශේෂයෙන් පුංචි ළමුන් වෙනුවෙන් නත්තල් සීයා රට පුරා ඇවිදිමින් ගේ දොරකඩට ඒවි යැයි ළමෝ සිතා සිටිති. මේ දරුවන්ගේ සුන්දර සතුටක්ය.

දරුවන්ට සතුටත් ගුණ ධර්මත් ලගාකර දීමට වැඩි හිටියන් නත්තල යොදා ගන්නේ නම් නත්තලේ අගය තවත් වැඩි වනු ඇත. එය එසේ කිරීමට වැඩිහිටියන් නුවණින් යුතුව කටයුතු කළ යුතුය.

තව පැත්තකින් අපේ රටේ පමණත් නොව ලෝකයේම දක්නට ලැබෙන ඊළඟ අවිචාරවත් සිද්ධිය වන්නේ සියලු ආගමික සංස්කෘතික උත්සව වෙළඳ ප්‍රජාව විසින් සියතට ගැනීමයි. ගෙදරක මඟුලක් හෝ අව මගුලක් තිබුණත් වෙළන්දා අතට මුදල් යෑම වැළැක්විය නොහැක. එහෙත් වෙළඳ ආර්ථික රටාව තුළ සංස්කෘතිය ආගම මඟුල අවමගුල පවා විකිණී යන ස්වභාවයට පත්වී ඇත. එහි අවශ්‍යතාව ඇති පුද්ගලයාට අවශ්‍ය විදියට අවශ්‍ය දේ කිරීමට ඉඩක් ලැබී නැත. නත්තල හෝ වේවා උත්සවය හෝ වේවා මංගල්‍යයක් හෝ වේවා අවමගුලක් හෝ වේවා වෙළඳ ප්‍රජාව විසින් කරන සැලසුමක අප සිර කරුවෙකු බවට පත්වී ඇත.

වෙළෙන්දාගේ සිරකරුවෙකු වන අප අපේ සියලු දේ වෙළන්දාට අවශ්‍ය විදියට කළයුතුව ඇත. එයින් අප නොදැනුවත්වම වෙළන්දාට අලෙවි වී යන අතර අපගේ මූඛ්‍ය පරමාර්ථය ඉටු නොවී ප්‍රදර්ශනයක් බවට පමණක් පත්වෙති. මේ වෙළඳ ආර්ථිකය විසින් අප ගේ ආගමික සංස්කෘතික ඇදහිලි විශ්වාස අරමුණු සියල්ල උඩු යටිකුරු කර දමා ඇත. වෙළඳ රැල්ලට හසුවන ජනයා වෙළෙන්දාගේ ගොදුරක් බවට පත් වී තිබීම කෙතරම් ඛේදජනක ද?

ආගමික උත්සව වළ මූළිකම පරමාර්ථය විය යුත්තේ ආධ්‍යාත්මික ගුණ වගාවයි. ඒ සඳහා ඒ ඒ ආගම් ලබ්ධිකායා විසින්ම තේරුම් ගත් ක්‍රම වේදයක් සකසා ගත යුතුය. ඒ සඳහා තම තමා විසින් විශ්වාස කරන දහම පිළිබඳ තමාට අවබෝදයක් තිබිය යුතුය. එසේ නොවන විට වෙළන්දන් විසින් අප හසුරවනු ඇත. ඒ දැනුම තමා විසින්ම ලබා ගත යුතුවාසේම ඒ ඒ ආගමික නායකයන් විසින් ද තම අනුගාමිකයින්ට ලබා දිය යුතුය. ඒ දැනුම ඇතුව නත්තල සැමරිය හැකිනම් එය ලෝකයටම අර්ථ සිද්ධිය සඳහා හේතුවනු ඇත. ඒසේ නොවන විට ඒ ඒ ආගමිකයා අධ්‍යාත්මික වශයෙන් හා ආර්ථික වශයෙන් පිරිහෙයි. එසේ පිරිහුන අය මෝක්ෂය උදා කර ගනීද යන්න සැක සහිතය.

# ලේනා පවුලේ සාමාජිකයෙකු වන හම්බාවන්

**ගමන් වෙහෙස නිවා ගැනීම සඳහා ගසක් යට ගල්කුලක ගිමන් හරින වනජීවී අධ්‍යක්ෂ වෛද්‍ය නන්දන අතපත්තු මහතාට හම්බාවෙකු මුනගැහෙන්නේ අහම්බෙනි. හම්බාවා යනු සාමාන්‍යයෙන් ජනතාවට ඉතා කලාතුරකින් දකින්න ලැබෙන නිශාචර සත්වයෙකි. ලේනා ගේ කුලයට අයත් මෙම සතාට අහසේ පාවීමටද හැකියාව ඇත.**

“අපි සාමාන්‍යයෙන් කැලේ යද්දී දඩයම් පිහියක් අරගෙන යනවා. කැලේදි ඇති වන විවිධ අවශ්‍යතාවලදී පාවිච්චි කරන්න. මාත් එක්ක ගිය ලලිත් එක පාරටම දිරාපත් වුණු ගහේ මුලට දඩයම් පිහියේ මොට පැත්තෙන් තට්ටු කර කර තාලයක් තියන්න ගත්තා. අර ලස්සනට හිටිය කුරුල්ලො ඔක්කොම බයේ ඉගිලිලා ගියා. මට ටිකක් කේන්ති ගියා තමයි, ඒත් එක පාරටම ඒ කේන්තිය නිවල දාන්න කදේ ගුලක් අස්සෙන් පුංචි හොම්බක් දාල බලපු කෙනෙක් සමත් වුණා.

දඩයම් පිහියෙන් තට්ටු කරන සද්දෙට හොඳටම තේරුණා ඒ ගහේ අරටුව දිරලා බෙනයක් වෙලා තියෙන්නෙ කියලා. ඒ බෙනය අස්සේ හුගක් සත්තුන්ට රැකවරණය තිබෙනවා. ඒත් නිදාගෙන ඉද්දී ඇදුණු මේ තට්ටු කරන සද්දෙ නිසා බය වුණු පුංචි ලේනෙක් වගේ සතා ගහ උඩටම දිව්වා. ඒ වුණාට එයාට පැන ගන්න වෙන කිසිම ගස් අත්තක් ළඟක තිබුණේ නැහැ. ඒ පාර මේ ලේනා එක පාරටම අත්තටු දිග හැරලා සරුංගලය වගේ අහසේ පාවෙන්න ගත්තා. එතකොටයි අපි දැනගත්තේ එයා හම්බාවෙක් කියලා.”

හම්බාවන් වෙනත් සතුන් මෙන් නගරබදව හෝ ගම්බදව මිනිස් වාස හමුවේ දක්නට නොලැබෙන්නකි. උන් තවමත් ඉතිරිව ඇත්තේ ගං ඉවුර අසබඩ රූස්ස වනාන්තර වල ගස් මුදුන් වල පමණි. එහෙත් නිශාචරයන් නිසා වන පෙතේදී වුව නිරන්තර උන් දැක ගැනීම උගහට බවය වෛද්‍ය අතපත්තු පවසන්නේ.

“ලේන කුලයට අයත් වුණත් මේ සතුන්ගේ හතර අතට විහිඳුණු පාද යුගල මැදින් සම් පටලයකින් බැඳිලා. හම්බාවන්ගේ විශේෂ දෙකක් දකින්න පුළුවන්, එකක් අළු හම්බාවා. අනෙකා කුඩා හම්බාවා. අළු හම්බාවාගේ ශරීර ප්‍රමාණ අනෙකාට

**“ලේන කුලයට අයත් වුණත් මේ සතුන්ගේ හතර අතට විහිඳුණු පාද යුගල මැදින් සම් පටලයකින් බැඳිලා. හම්බාවන්ගේ විශේෂ දෙකක් දකින්න පුළුවන්, එකක් අළු හම්බාවා. අනෙකා කුඩා හම්බාවා. අළු හම්බාවාගේ ශරීර ප්‍රමාණ අනෙකාට වඩා තරමක් විශාලයි. ඒත් දෙවර්ග යටම තිබෙන්නේ බොහෝ දුරට සමාන ගති ලක්ෂණ.**

වඩා තරමක් විශාලයි. ඒත් දෙවර්ගයටම තිබෙන්නේ බොහෝ දුරට සමාන ගති ලක්ෂණ. මේ අය ශ්‍රී ලංකාවට ආවේනික සතුන් නොවේ. මිනිසුන්ගෙන් මේ සතාට සෘජුවම බලපෑමක් නැතත්, ඇඩි වඳ වීමේ තර්ජනයකට ලක් වෙලා තිබෙන්නේ මිනිසුන් නිසාමය. ගස් කපා වන විනාශ කරලා මේ සතුන් ඉන්න තැන් අහිමි වෙන නිසා ඇඩි වඳ වී යෑමේ තර්ජනයකට ලක් වූ සතකු ලෙසයි හම්බාවා ගැනෙන්නේ.”

හම්බාවාගේ විශේෂත්වය වන්නේ සිරුර දෙපස ඇති සම් පටල දෙකය. මෙය විනිවිද පෙනෙන අතර හම්බාවා ඇවිදින විට ඒ තටු කෑලී නොපෙනෙන ලෙස සිරුර දෙපස හැකිළී



පවතී.

“පාවෙනකොට පේනවා හොඳටම මේ හම්බාවාගේ එකම පැත්තෙ ඉදිරිපස පාදය සහ පිටුපස පාදය මේ සමෙන් හා වෙලා තිබෙන්නේ කියලා. ඒත් ඒවා තටු සලනවා වගේ ඉහළ පහල කරන්න බැහැ. මේ සම් පටලය මැණික් කටුව අසල තිබෙන ආධාරකයකින් නැවූ විට වැලමිට දක්වා හැකිළෙනවා. ඒත් අය ඇවිදින්න බාධාවක් නොවේ. එහෙම කියලා හම්බාවුන් වේගයෙන් ඇවිදින්නෙත් නැහැ. හරි කම්මැලිකමින් ගමන් කරන්නේ. පිඹුරන් වැනි සතුන් හැර විශේෂ විලෝපිකයන ගෙන් ගැලවී යන්න තරම් ගැටලුවක් මේ නිශාරචරයින්ට නැහැ.

රෝම පිරුණු සිලින්ඩරාකාර වල්ගයක් හම්බාවන්ට තිබෙන්නෙ. හිස සහ කඳ එකට ගත්විට එන දිගට වඩා වැඩි දිගක් මේ වල්ගයට තිබෙනවා. කොදු නාරටිය දිගේ ඇති රෝම වඩා දිගයි. සිනිඳුයි. අළු හම්බාවාගේ වල්ගය නැතිව සිරුර අඟල් දහසය හමාරක් පමණ දිග වුවත් කුඩා හම්බාවාගේ සිරුරේ දිග ඇත්තේ අඟල් 12ක් පමණ ප්‍රමාණයක්.

හම්බාවනුත් ලේනුන් වගේම ඉදිරි පාදවල නිය හතරක් සහ පසු පාදවල නිය පහක් බැගින් දරනවා.

නමින් අළු හම්බාවා වුණත් මේ සතා කියන තරම් අළු පාට සතෙක් නොවෙයි. අළුවට හුරු දුඹුරු කළු පැහැයක් තමයි තිබෙන්නේ. පාද යාකරන සම ලී අළු පැහැයක් දරනවා. වල්ගය මුලසිට අගට කළු දුඹුරු පැහයක් ගන්නේ. හොම්බ අවට සහ හිසේ කුඩා අදුරු පැල්ලම් දකින්න පුළුවන්. බඩ පැත්තට වන සිරුරේ ඇතුළු ප්‍රදේශය අළු සුදු පැහැයෙන් සැදී තිබෙනවා. ඒත් පොඩි හම්බාවා චෙස්නට් පාටයි.”

වෛද්‍ය අතපත්තු විද්‍යාත්මකව හම්බාවා විස්තර කරන්නේ එසේය. ඒ අතරට ඔහු තවත් කරුණු එක් කරයි.

“අළු හම්බාවියකට නම් එක වරකට එක පැටවයි. ඒත් කුඩා හම්බාවියන් වරකට පැටවුන් දෙදෙනෙකු බිහිකරන අවස්ථා තිබෙනවා. මේ වර්ග දෙකම බොහෝ විට ගැබ්ගන්නේ වසරේ මුල් මාස දෙක තුන ඇතුළත. ඒත් නිශ්චිත අභිජනන සමයක් තිබෙනවා කියලා ස්ථිරව කියන්න බෑ. ගැහැණු සතාට ස්තන ග්‍රන්ථි යුගල තුනක් තිබුණත් පැටවුන් වැඩිපුර ඇති වන්නේ නෑ. හැබැයි මේ පැටවුන්ට සනීපෙට ඉන්න පුළුවන් වන විදිහට ගස් බෙනයක සුව පහසුව දෙන පරඬැල් කොළ වර්ග අතුරලා සුව යහනක් සදා දෙන්න හම්බා මව කටයුතු කරනවා. මුන් ශාක භක්ෂක නිසා ඉරා කන්න අවශ්‍ය රදනක දත් නෑ. පලතුරු වර්ග, මල්, දළු කොළ කන අතරම ඉඳ හිට කුඩා කුරුමිණියෙක්, සමනළයෙක් මෙනු පතට ඇතුළත් කරගන්න හම්බාවුන් අමතක කරන්නේ නෑ.

**ඇදිරි වැටෙද්දී ගස්බෙන වලින් ඉවතට විත් තමන්ගේ රාජකාරි අරඹන්න පටන් ගන්නවා. කැලේට කොලේට ආදරේ කරන අයට නම් හම්බාවාගේ හඬ හරිම මිහිරියි. ඉතා සීග්‍රයෙන් වඳවී යන සතෙකු වන හම්බාවා නුදුරු අනාගතයේදී අපිට දැක ගන්නට නොලැබීයාමටද ඉඩ ඇත.**

හම්බාවුන්ටත් විශාල ඇස් දෙකක් තිබෙනවා. ලුමිනස්පාට ස්ථරයකින් එය ආවරණය වී තිබෙන්නේ.

ඇදිරි වැටෙද්දී ගස්බෙන වලින් ඉවතට විත් තමන්ගේ රාජකාරි අරඹන්න පටන් ගන්නවා. කැලේට කොලේට ආදරේ කරන අයට නම් හම්බාවාගේ හඬ හරිම මිහිරියි. ඉතා සීග්‍රයෙන් වඳවී යන සතෙකු වන හම්බාවා නුදුරු අනාගතයේදී අපිට දැක ගන්නට නොලැබීයාමටද ඉඩ ඇත.

## ශ්‍රී ලංකාව තුල කොරෝනා වයිරසය (COVID-19) පැතිරීම වැළැක්වීමට සියලු දෙනා මෙම පියවර 9 පිළිපැදිය යුතුය




01 ඔබගේ දෑත් නිතරම, නිසි පරිදි සෝදන්න

02 ඇස්, කට සහ නාසය ඇල්ලීමෙන් වලකින්න

03 කිවිසුම් අරින විට වැලමිටේ ඇතුළු පැත්ත හෝ ටිෂු භාවිතා කරන්න. භාවිතා කළ ටිෂු පියනක් සහිත කසළ බඳුනකට දමා වසන්න. පසුව සනීපාරක්ෂක ද්‍රාවණයකින් හෝ සබන් යොදා නිසි පරිදි අත සෝදන්න

04 සෙනඟ ගැවසෙන ස්ථානවලට යාමෙන් වලකින්න

05 ඔබට උණ හෝ ස්වසන ආබාධ ඇත්නම් නිවසින් පිටතට යාමෙන් වලකින්න

06 ඔබට කැස්ස, උණ, හුස්ම ගැනීමේ අපහසුතාව වැනි රෝග ලක්ෂණ තිබේ නම් වහාම දුරකථනය ඔස්සේ වෛද්‍ය උපදෙස් ලබාගන්න

07 සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ ලෝක සෞඛ්‍ය සංවිධානය වැනි පිලිගත් ආයතන වලින් පමණක් නිතර නිවැරදි තොරතුරු ලබා ගන්න

08 අන් අයගෙන් මීටරයකවත් දුරස්ථභාවයක් තබා ගැනීමට උත්සාහ ගන්න

09 දිනපතාම මතුපිටවල් සියල්ල පිරිසිදු කර විෂබීජහරණය කල යුතුයි

@hpbsrilanka
www.hpb.health.gov.lk

සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය
சுகாதார மேம்பாட்டு பணியகம்
Health Promotion Bureau

World Health Organization
Sri Lanka

@WHOSriLanka
www.who.int/SriLanka


DUBAI
Airline
Air fare
Days of Operation
Sri Lankan Airlines
Starting from Rs. 46,550/-
Tuesdays / Saturdays
Emirates
Starting from Rs. 49,500/-
Wednesdays / Fridays / Saturdays / Sundays
Oman Air
Starging from Rs. 44,800/-
(2 hr transit)
Thursdays
** Conditions Apply
Ceylon Shipping Lines Travels
No. 450, D.R. Wijewardena Mawatha,
Colombo 10.
011 - 2689500
M : 077 - 2672970
077 - 3572835
077 - 3561210
E : csltravels@sltnet.lk

# උදුවන නත්තලක අසිරිය



***සීනු හඬින් ලොව
පිබිදෙනවා
නත්තල දොරළඟ
හිනැහෙනවා
බෙත්ලෙහෙමේ අද රෑ
උපන්නා
ලස්සන බිළිදෙක් මල් වාගේ***

ගරු මර්සලින් ජයකොඩි පියතුමාණන් ගේ මේ නත්තල් ගීතය දෙසැම්බර් පුරාවට අපේ දෙසවන් නින්නාද වෙද්දී නත්තල් අසිරිය අපිට දැනෙයි. ලෝක ජනතාවගෙන් අති බහුතරයක් කතෝලික ලබ්ධිකයින් වන අතර ඉන් වැඩි පිරිස යුරෝපයේ වාසය කරති. සෑම වසරකම දෙසැම්බර් 25 වනදාට නත්තල යෙදෙන අතර එම දිනය ක්‍රිස්තුන් වහන්සේ ගේ උපත සිදුවී යැයි විශ්වාස කරමින් ජනයා සමරති.

මෙම දිනය ලොව පුරා සම්මතයක් ලෙස භාවිතා කලද බයිබලය ඇසුරින් හෝ පුරා විද්‍යාත්මක සාක්ෂි අතරින් හෝ වෙනත් මූලාශ්‍රයන් මගින් මෙම දිනය එදාමයි යන්න තහවුරු වී නැත. දිනය ගැන එතරම් වැදගත් කමක් නැතත් ක්‍රිස්තුස් වහන්සේ ගේ උපත හෝ උන් වහන්සේ ගේ පැවැත්ම පිළිබඳව ගැටළුවක් නැත.

ජෙරුසලමේ දී උපත ලැබූ ක්‍රිස්තුන් වහන්සේ ගේ දහම අද ජෙරුසලම ඇතුළු මැදපෙරදිග කලාපය තුළ එතරම් ව්‍යාප්තවීමක් නැත. දෙසැම්බර් මාසය පුරා කතෝලික ලබ්ධිකයින් නත්තල සැමරීමට සූදානම් වන අතර ඒ වෙනුවෙන් විශේෂ උත්සව ආගමික කටයුතු රැසක් ඉටුවෙයි.

ගව ලෙනක උපත ලබන ක්‍රිස්තුන් වහන්සේ ගේ උපත සංකේතවත් කරමින් ගවලෙනක් නිර්මාණය වීම නත්තලේ විශේෂ සැරසිල්ලකි. දහතුන්වන සියවසේ දී ඉතාලියේ ශුද්ධ වූ ෆැන්සිස් තුමන් විසින් ප්‍රථමවරට ගවලෙන නිර්මාණය කළ බව කියවෙයි. ඉතිහාසයේ දැක්වෙන පරිදි ඕක් ගස වටා සිට කතෝලික බැතිමතුන් විසින් ගීතිකා ගායනා කිරීම හේතුවෙන් ලොව මුල්වරට නත්තල් ගස ජර්මනියෙන් ආරම්භ වූ බව කියවෙයි. නත්තල් කාඩ් පත මුලින්ම ඇරඹී ඇත්තේ එංගලන්තයේය. ඒ මුද්‍රණ ශිල්පය එන්නත් කලිනි. කැටයම් යෙදූ මැටිපුවරු වල ප්‍රථම වරට නත්තල් කාඩ් පත් නිර්මාණය වී ඇත.

නත්තලේ තවත් වැදගත් විශේෂාංගයක් වී ඇත්තේ නත්තල් සීයාය. නත්තල් සීයා වඩාත් ජනප්‍රිය පුංචි දරුවන් අතරය. මෙය පියකරු දසුනක් වන අතර දැන් දැන් කෘතිම නත්තල් සීයලා ද කඩ සාප්පු වල එල්ලා ඇත. නත්තල් පප්පා ලෙසින් ද හඳුන්වා දෙන මොහු රතු ලෝගුවකින් සැදී සුදු තොප්පියක් පැළඳ බඳ වටා ඇති කළු පටිය දිග සුදු රැවුල ඔහුට අලංකාර තේජසක් හා ප්‍රතාපවත් බවත් මෙන්ම පියකරු බවක් ද පෙන්නුම් කරයි. ගෙජ්ජි බැඳපු තෑගි බෝග පිරුණු මේස් දෙකද තෑගි පුරවා ගත් ලෝගුව ද සිනා කටක් පුරවා ගත් නත්තල් සීයා පුංචි දරුවන්ට ටොෆි චොක්ලට් සෙල්ලම් බඩු ලබා දෙමින් ගමින් ගම නගරයෙන් නගරය සැරිසරන අයෙකි.

නත්තල් සීයාට ද දිගු ඉතිහාසයක් ඇත. ක්‍රි. ව. හතරවන සියවසේදී තුර්කියේ සිටි නිකොලොස් නැමැති පරිත්‍යාගශීලී ධනවතා මෙම විශේෂාංගය අරඹා ඇත. ඔහුගේ ධන පරිත්‍යාගය නිසා ඇරඹුණු නත්තල් සීයා දැන් ලොව පුරා ජනප්‍රිය වී ඇත. පසුව මෙම නිකොලොස් පූජකයෙකු මෙන්ම සාන්තුවරයෙකු බවට පත්විය. ඉතිහාසයේ නත්තල් සීයා නමින් නිශ්චිත පුද්ගලයෙකු නොවූවත් නිකොලොස් ගේ හඳුන්වාදීමත් සමඟ එය ඇති විය. වර්තමාන නත්තල් සීයා ගේ චරිත ස්වරූපය චිත්‍රශිල්පීන් කලාකරුවන් ආදී නිර්මාණකරුවන් විසින් ඉතා අලංකාර ලෙස නිර්මාණය කොට ඇත.

නත්තල් සීයා ලංකාවට හඳුන්වා දෙන්නේ ඉංග්‍රීසි ජාතිකයින් විසිනි. ඒ දහනවවන සියවසේදීය.



ලංකාවේ දී නත්තල් සීයා සමඟ පිරිස් පැමිණ මෙඩ්ලීනයක් හා රබානක් වයා දරු දැරියන්ට තෑගි බෝග ලබා දෙයි. අනතුරුව නත්තල් සීයා හිස නමා ආචාර කර තොප්පියක් ගෙහිමියාට දිගු කරයි. ගෙහිමියන් එයට සුළු මුදල් පරිත්‍යාගයක් ද ලබා දෙති. නත්තල් සීයාගේ තෑගි ඔලගුව නිර්මාණය වී ඇත්තේ මේස් කකුලකිනි. එය මේස් කකුලක් වීමට ද විශේෂ හේතුවක් විය. නිකොලොස් පියතුමාට දිළිඳු දරුවෙකුට ඔහුට නොදැනෙන්නට ආධාරයක් ලබා දීමට අවශ්‍ය විය. දිනක් ඔහු රන්කාසි ස්වල්පයක් ගෙන එම දරුවාගේ නිවසේ දුම් කවුළුවෙන් රන්කාසි ගෙතුලට දැමීය මෙම රන්කාසි වැටී තිබුණේ එහි එල්ලා තිබූ මේස් කකුලකටය.

ලංකාවට කතෝලික ආගම පැමිණෙන්නේ පෘතුග්‍රීසි ආක්‍රමනයත් සමඟය. පෘතුගීසි, එංගලන්ත, ලන්දේසි ආදීන් ලෝකය ආක්‍රමනය කරමින් අධිරාජ්‍යවාදය ගොඩ නැගූ යුගයේ ඔවුන් එක් අතකින් කඩුවත් අනිත් අතින් බයිබලයත් රැගෙන ගිය බව කියයි. ඔවුන් සිය ආගමට ප්‍රධානත්වය දෙමින් ආගමට බඳවා ගැනීමේ සාහසික ක්‍රියාමාර්ග වල යෙදුනි. ලෝක ඉතිහාසය තුළ කුරුස යුද්ධ පවා බිහි විය. සිය ආගම් ව්‍යාප්ත කිරීම උදෙසා ජනයා දැනුවත් කරමින් ආගමික අවබෝධය ලබා දීම වෙනුවට ජනයාට භෞතික වරදාන ලබා දෙමින් කතෝලික ප්‍රජාව බහුල කිරීමේ උත්සාහයක යෙදුනු බැවින් කතෝලික ව්‍යාප්තවාදීන්ට ඇත්තේ පැහැපත් ඉතිහාසයක් නොව ලේ තැවරුණු ඉතිහාසයකි.



කෙසේ නමුත් අද වනවිට නත්තල යනු හුදු ව්‍යාපාරිකයින් ගේ මුදල් උපයන වෙළඳ සන්දර්ශනයකි. ව්‍යාපාරික රටාවක් තුළ මුදලට මුල්තැන දෙන වර්තමාන ආර්ථික දේශපාලන රටාව තුළ කතෝලික ආගමද අලෙවිකරණයට ගොදුරුවීම පුදුමයක් නොවේ. බහුතර කතෝලික ජනයා ද එය ආධ්‍යාත්මික වපසරියකට කොටු නොකොට භෞතික අර්ථ ශූන්‍ය ක්‍රියාවන්ට නැඹුරු වෙමින් තිබීම කණගාටුවට කරුණකි.

සමාජ ආර්ථික සහජීවනය ගොඩ නැගීම පසෙකට ලා මසට හා සුරාවට මුල්තැන දෙමින් බමන මතින් යුතුව මස් අනුභව කිරීම තුළ ඔවුන්ගේ අධ්‍යාත්මය බිඳ වැටෙන බව සාමාන්‍ය ජනයා නොපිළිගත්තත් ක්‍රිස්තුන් වහන්සේ හෝ දෙවියන් වහන්සේ එය අනුමත කරාවි දැයි ආගමික නායක කාරකාදීන් ගේ අවධානයට යොමු විය යුත්තකි.

නත්තල ඉලක්ක කරමින් ඌරන් කකුලන් එළුවන් ගවයින් දස දහස් ගණනින් සිය ජීවිත පූජා කරන්නේ ක්‍රිස්තු භක්තිකයාගේ දිව පිනවීම උදෙසාය. සැමට සාමය සතුට ප්‍රේමය ප්‍රාර්ථනා කරන දෙවියන් වහන්සේ තිරිසනාට මරණය ගෙන දීම යුක්ති සහගත දැයි විමසා බැලිය යුත්තකි.

වෙනදාට වඩා වැඩි වැඩියෙන් අලෙවි වන සුරාව නිසා සුරාසැල් හිස්වන අතර බොහෝ කතෝලික ලබ්ධිකයින් බමන මතින් යුතුව දෙවියන් වහන්සේ සැමරීම තුළින් දෙවියන්ට යුක්තිය ඉටුවේ දැයි තම තම නැණ පමණ විමසා බැලිය යුත්තකි. ආගම දහම කුමක් වුවත් පර පණ නැසීමටත් ඒ සඳහා ලබා දෙන අනුග්‍රහය පිළිබඳවත් විමසිය යුතුය.

ආගම ජනයාට අවශ්‍ය වන්නේ අධ්‍යාත්මික හැදියාව පෝෂණය කිරීම වෙනුවෙනි. ඒ සඳහා කායික හා මානසික හික්මීම අත්‍යාවශ්‍ය වේ. සුරාවෙන් සහ ලේ පිපාසයෙන් ඔද්දල්වන මිනිස් චිත්ත සන්තානය තුළ මානසික කායික සංවරය ගොඩ නැගෙන බව සිතිය නොහැක. ආගමික පිළිගැනීම තුළ දෙවියන් වහන්සේ ගේ මැවීම එය නම් දෙවියන්ගේ කැමැත්තත් ඒක නම් අපට කළ හැකි දෙයක් ද නැත. අපි එය ඒ ලෙසින්ම පිළිගන්නවා වෙනුවට කළ යුතුව ඇත්තේ කතෝලික දහම තුළ ඒ සඳහා යම් ඉඩ කඩක් ඇද්දැයි පරීක්ෂා කර බැලීමය.

කෙසේ නමුත් වර්ෂාවසානයේ එළඹෙන නත්තල පොදු ජනයාට අතිශය පියකරු ප්‍රසන්න හැඟීමක් ගෙනදෙන සොඳුරු දසුනකි. කඩසාප්පු බඩු භාණ්ඩයන් ගෙන් පිරී ඉතිරී ගොස් රටම උත්සව සමයක අසිරිය ගනිති.

කතෝලික ඥාති හිත මිත්‍රාදීන් ඇසුරේ සමගි සමාදානයත් මිත්‍රශීලීත්වය බැදී වැඩිවී යන අතර අලුත් මිතුදම් වැඩි වී ගොස් තිබෙන මිතුදම වැඩිවන සමයකි. පොදු ජනයා ආගමික පූජෝපහාරයන් පවත්වා අනතුරුව සතුටු සාමීචියේ යෙදී ඇයි හොඳයි කම් වැඩි දියුණු කරගන්නා යුගයකි. නත්තල එළඹීමෙන් අනතුරුව පුරා මාසයක් පමණ උත්සව සමය සමරන කතෝලික ලබ්ධිකයින් නව වසර එළඹීමත් සමඟ නව ජීවන රටාවකට අත්වැල් බැඳ ගනිති.

# බස් කැලෑ...



වර්තමානයේ නගර කොන්ක්‍රීට්වලින් හා යකඩ වලින් ආවරණය වූ වනාන්තර බදුය. අද මෙවැනි නගරයක බස් රථයකින් නැගී යෑම මගියා මහත් වෙහෙසට පත් කරන්නකි. ගහ කොලින් ගහන වූ වනාන්තරයක උණුසුම් දිවා කාලය ගත කිරීම යනු ගතට සිසිලසක් දැනෙන මනසට සුවයක් දැනෙන තැනකි. අඩුම තරමින් එක් ගහක් යට හෝ සිටීමට හැකි නම් ඒකත් සුවයකි.

මේ සඳහා අපූරු විකල්පයක් තායිලන්තයේ මල් සැපයුම් කරුවෙකු වන ඇල්ෆි ලින් හඳුන්වා දී ඇත. Forest Bus (කැලෑ බස්) ලෙස නම් කර ඇති මෙම බස් ඇතුළත විවිධ ශාඛ වර්ග වවා ඇත. මෙම බස් රථ හරියටම හරිතාගාරයක ස්වභාවය උසුලයි. අසුන් සියල්ල පාසි වලින් වැසී ඇති ලෙස හැඩ ගන්වා ඇත. ඕකිඩ් වර්ග ලිලී මල්, මීමණ වර්ග බහුලව තිබේ. ඉතා අලංකාර කුඩා වනාන්තරයක ස්වභාවය ගන්නා මෙම බස් රථ තුළ ගමන් ගන්නා විට මගියාට දැනෙන්නේ වනාන්තරයක ඉදගෙන ඉන්නවා යන හැඟීමකි.

මෙම බස් රථයේ ගමන් ගැනීම සඳහා මගීන් ගෙන් වැඩි ඉල්ලුමක් ඇති බව කියවේ. එසේම මෙම බස් රථය සතියක කාලයක් පුරා විශේෂ ගමන් වාරයක් ලෙස ගමනාගමනය සිදු කරයි.


## Ceylon Shipping Lines Ltd.
### Printing Department



CSL Printing is a fully fledged design printing department equipped with latest technology including Computer offset printing from concept to finished product, with the capacity and capability to undertake all types of commercial printing for local & overseas customers.

**Ceylon Shipping Lines Ltd.,**
**Printing Department,**
**No. 758/3, Dr. Danister De Silva Mawatha,**
**Colombo 09.**
**Tel: 011 - 2683237 Fax: 011 - 2683238**
**E- mail: cslpri@sltnet.lk**

**Head Office:**
**Ceylon Shipping Lines Ltd.,**
**No. 450, D.R. Wijewardana Mawatha,**
**Colombo 10.**
**Tel: 011 - 2689500 - 8**

# රටට අහිමි වන ඇත් පරපුර



**වෙඩි තබා ඝාතනය කරන ලද ගල්ගමුවේ දළ පුට්ටුවාගේ මළ සිරුර කහගල්ල පල්ලෙකැළේ අභයභූමි රක්ෂිතයේ හොරොව්වැව ඉස්මත්තේ ඝන කැලෑබද ප්‍රදේශයක තිබියදී විශේෂ කාර්ය බලකාය මගින් සොයා ගෙන ඇති බව වනජීවී අංශ සඳහන් කරයි.**

සිවුපාවුන් අතර විශාලම සත්වයා වන හස්තියා අනාදිමත් කාලයක සිට ශ්‍රී ලංකාවේ සුලබව දක්නට ලැබුණු සත්වයෙකි. හස්ති රාජයා ලෙසින් ගෞරවාර්ථව හඳුන්වන දළ ඇතුන් දේශීය සංස්කෘතියට නැතුවම බැරි සත්වයෙකි. දළ ඇතුන් පිළිබඳ විවිධ කතා ගීත කාව්‍ය ආදී බොහෝ දේ දේශීය ජනශ්‍රැතියට සාහිත්‍යයට ඇතුළත් වී ඇතිවාක් පමණක් නොව ජනයාගේ ගෞරවාදරයට පාත්‍රවන සත්වයෙකි.

මෙවැනි සද්දන්තයින් මරා දැමීම යනු බොහෝ දෙනෙකුගේ සිත් මොහොතකට හෝ කම්පනය කිරීමට සමත්වන සිද්ධියකි. එහෙත් පසු ගිය මාස කිහිපයක සිට අපේ රටේ දළ ඇතුන්ට අඳුරු අපල දුර්භාග්‍යමත් කාලයක් උදාවී ඇත. එහිදී ජනතා සිත් සතන් මොහොතකට තැති ගැන්වූ සිද්ධිය නම් ගල්ගමුවේ දළ පූට්ටුවා මරා දැමීමයි.

මෙවන් අපරාධ කිරීම සුළු පටු සිද්ධියක් නොවේ දරුණු කුරිරු සාහසික මානසිකත්වයක් තිබිය යුතුමය. එවැනි මිනිසුන් අපි වැනි සමාජයක සිටීම ගැන අපි කනගාටු විය යුතුය.

පසුගිය කාලයේ මහත් ආන්දෝලනයට තුඩු දුන්නේ අනවසරයෙන් අලි ඇතුන් රැක බලා ගැනීම බරපතල වරදක් විදියටය. ප්‍රසිද්ධ භික්ෂූන් වහන්සේලා පවා සිරගත වූ එවැනි සිද්ධි තිබිය දී වනයේ නිදහසේ සැරිසරණ රජයේ භාරකාරත්වයේ සිටින ඇතුන් මෙළෙස ඝාතනය වන්නේ නම් රජය වන සතුන් පිළිබඳව දක්වන අවධානය ගැන අපි නැවත සිතා බැලිය යුතු නොවේද?

වෙඩි තබා ඝාතනය කරන ලද ගල්ගමුවේ දළ පූට්ටුවාගේ මළ සිරුර කහගල්ල පල්ලෙකැළේ අභයභූමි රක්ෂිතයේ හොරොව්වැව ඉස්මත්තේ ඝන කැලෑබද ප්‍රදේශයක තිබියදී විශේෂ කාර්ය බලකාය මගින් සොයා ගෙන ඇති බව වනජීවී අංශ සඳහන් කරයි.

හමුවී ඇති මළ ඇත් සිරුර මීට මාසයකට පමණ පෙර මිය ගිය ඇතෙකුගේ බව වනජීවී අංශ කියා සිටියි. ඇත්දළ කැපූ ලකුණු පැහැදිලිවම දැක ගැනීමට හැකි වූ බවත් හමුවූ සිරුර බොහෝ විට ගල්ගමුවේ දළ පූට්ටුවාගේම විය හැකි බව වනජීවී අංශ විශ්වාස කරයි.

පසුගියදා රුපියල් ලක්ෂ 20 කට ඇත්දළ යුවළක් හා ගජමුතු හයක් අලෙවි කිරීමට සූදානම්ව සිටි අවස්ථාවේ දී සුඛෝපභෝගී මෝටර් රථයක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු පානදුර වලාන දූෂණ මර්දන ඒකකය මගින් අත්අඩංගුවට ගැනීමෙන් පසු ඇති වූ සැකයක් මත ගල්ගමුවේ දළ පූට්ටුවා සොයා මෙම මෙහෙයුම ආරම්භ කෙරිණ.

වනජීවී නිලධාරීන් අතුරුදන් වූ දළ පූට්ටුවා සොයා ආරම්භ කර තිබූ මෙහෙයුමට වනජීවී අමාත්‍යාංශයේ උපදෙස් මත විශේෂ කාර්ය බළකාය, පොලීසිය සිවිල් ආරක්ෂක බළකාය එක්ව ඒකාබද්ධ මෙහෙයුමක් ආරම්භ කර තිබුණි. මෙම මෙහෙයුම දළ පූට්ටුවා සැරි සැරූ තහල්ල රක්ෂිත වනාන්තරය ආශ්‍රිතව වර්ෂාවද නොතකා සිදු කළ අතර ඇත් සිරුර සොයා ගැනීමට හැකි විය.

වයස අවුරුදු 44 වන දළ පූට්ටුවා ලංකාවේ වනාන්තර ආශ්‍රිතව වාසය කළ සද්දන්ත ඇතෙකි. පරිසර හිතකාමීන් ගල්ග මුවේ දළ පූට්ටුවා නම් වූ මෙම ඇතාගේ ජීවිතය අනතුරේ බව නිතර නිතර පෙන්වා දුන්නේය. ඒ මෙම ඇතාට කීප අවස්ථාවකම වෙඩි තබා තිබීම හේතුවෙන් හා මාධ්‍ය මගින් මෙම ඇතා නිතර නිතර ප්‍රදර්ශනය කිරීම නිසා ජාවාරම්කරුවන්ගේ ඇස ගැටීම නිසාවෙනි.

ඒ නිසාම වනජීවී නිලධාරීන්ගේ අවධානය ලබා තිබූ ගල්ගමුවේ ඇතා ඉකුත් ඔක්තෝබර් මස මුල් සතියෙන් පසු වනජීවී නිලධාරීන්ගේ නෙත ගැටී නොතිබූ අතර අවසන් වරට හේරත් ගම මහා කිරිල්ල හා කුඩාකිවුල වැව ඉස්මත්තේ සැරිසරමින් සිට ඇති බව වනජීවී අංශ කියයි.

ඇත් දළ විකිනීමට ගොස් අසු වී ඇත්තේ ගම බාරදුන් රජයේ නිලධාරීන් දෙපළකි. ඒ ගල්කිරියාගම ප්‍රදේශයේ ග්‍රාම සේවා නිලධාරියෙකු හා වැඩ තහනමට ලක්ව සිටින පොලිස් නිලධාරියෙකි. මීට අමතරව තවත් එක් සැක කරුවෙකුද වැටලීමේදී පොල්පිතිගම පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත. ඒ අතර සැකකරුවන් සමඟ ඇත්දළ ප්‍රවාහනය කරමින් තිබිය දී අත්අඩංගුවට ගැනුණ මෝටර් රථයේ අංකය ව්‍යාජ එකක් බවටද තොරතුරු අනාවරණය වී ඇත.

ගල්ගමුවේ දළ පූට්ටුවාගේ දියවී ගිය මළ සිරුර හමුවී දින දොළහක් ගත වන්නටත් ප්‍රථම තවත් දළ ඇතුන් සතර දෙනෙකු මරා දමා ඇති බවට වනජීවී අංශ වලට තොරතුරු ලැබුණි.

දළ පූට්ටුවා වැනි ඇතෙකු මරා දැමා එහි ආන්දෝලනය තුනී වීමටත් ප්‍රථම මෙවැනි අපරාධ තවත් සිදුවීම තුළින් පෙනී යන්නේ රජයේ අකාර්යක්ෂමතාවද? එසේත් නැත්නම් අපරාධකරුවන්ගේ ප්‍රබලත්වයද? එසේ නම් එය රාජ්‍ය බලයටත් වඩා විශාල බලයක් ඇතුව පවතින්නක් විය යුතුය. හරියට ත්‍රස්තවාදයකට සමාන ක්‍රියාවකි.

කෙසේ නමුත් කුමන ක්‍රමයකින් හෝ රජය මගින් මෙය නවතා දැමීමේ වැඩ පිළිවෙලක් යෙදිය යුතුමය. රට පුරා පවතින අරාජිකත්වය වනසතුන්ට පවා සිය ජීවිත වලින් වන්දි ගෙවීමට සිදුවීම මොන තරම් අභාග්‍යයක්ද මොවුන් සතු දළ හා දළ තුළ පිහිටි ගජ මුතු ස්වභාව ධර්මයෙන් ලැබුණු දායාදයකි. ඒ ඔවුන්ගේ වාසනා ගුණයක් සමඟ ලැබුණකි. එය ඔවුන්ගේ අකල් මරණයට හේතුවක් නම් ඒ අපරාධයට සමස්ත සමාජයම වගකිව යුතුවා සේම මුළු සමාජයටම ස්වභාව ධර්මය දඬුවම් දෙනු ඇත.





# Sri Lankan Airlines will be operating below flights From Colombo for the period From 1st – 31st December 2020

| Flight number | Destination | Days of operation | Dep. time | Arr. time | Remarks |
|---|---|---|---|---|---|
| UL101 | MALE | WED | 0825 | 0920 | |
| UL101 | MALE | THU/FRI/SAT/SUN | 0720 | 0815 | |
| UL101 | MALE | MON | 0730 | 0825 | |
| UL103 | MALE | TUE/ SAT | 1945 | 2040 | |
| UL1207 | MILAN | MON / THU | 0005 | 0635 | |
| UL217 | DOHA | MON/ FRI | 1905 | 2135 | |
| UL225 | DUBAI | TUE/ SAT | 1835 | 2150 | |
| UL302 | SINGAPORE | WED / SUN | 0725 | 1355 | |
| UL454 | NARITA | WED/ SAT | 1820 | 0600 | |
| UL 503 | LONDON | MON/THU/SAT | 0010 | 0630 | |
| UL 503 | LONDON | TUE/WED/FRI/SUN | 0110 | 0730 | |
| UL 505 | LONDON | TUE / SAT | 0930 | 1025 | Eff. 12th Dec |
| UL553 | FRANKFURT | WED/ FRI | 2225 | 0520 | |
| UL 604 | MELBOURNE | 6/11/22/27 DEC | 1645 | 0815 | |
| UL 604 | MELBOURNE | 9/16/25/30 DEC | 1410 | 0540 | |
| UL606 | SYDNEY | WED / FRI | 1420 | 0620 | |
| UL866 | SHANGHAI | FRI | 1450 | 2350 | |
| UL880 | CANTON | WED | 1050 | 1900 | |

Ceylon Shipping Lines Travels,
No. 450, D.R.Wijewardena Mawatha,
Colombo 10
011 - 2689500

M : 077 - 2672970
077 - 3572835
077 – 3561210
E : csltravels@sltnet.lk



# දැදිගම කොටවෙහෙර

# රජ මහා විහාරය

**කොළඹ සිට මහනුවර දක්වා ගමන් කරනවිට කි.මී. 67 තරම් දුරක් ගියවිට නෙලුම්දෙණිය කුඩා නගරය හමුවෙයි. එයින් දකුණට හැරී යන මාර්ගය ඉතා අලංකාර පරිසරයකින් යුක්තය. කළු ශිකර අතරින් ඇදී යන මාර්ගය දෙපස රබර් වතු කෙත්වතු පොල්වතු වලින් ගහනව ඇළ දොළ ජල දහරා ගලා හැලෙන මාර්ග යේ අවට සිරි මනරම්ය.**

නෙලුම්දෙනිය හන්දියේ සිට කි.මී. 3-5ක් පමණ දුර කිට්ටු වන විට පාර අසලම දැදිගම කොට වෙහෙර දැකගත හැක. කොත් කැරැල්ලක් නොමැති පෞරාණික චෛත්‍යයකි. සත් කෝරලයට අයත් බෙලිගල් කෝරලයේ නැගෙනහිර කීරවැලි පත්තුවට මෙම ප්‍රදේශය අයත්ය. වටිනා ඓතිහාසික තොරතුරු රැසක් සඟවාගෙන තිබෙන ප්‍රදේශයකි. ක්‍රි. ව. 114- 136 පළමුවන ගජබා රජුගේ නීලමහ යෝධයාගේ උපන් ප්‍රදේශයද මෙම ප්‍රදේශයයි. ගජබා රජුගේ මාළිගය පිහිටි ප්‍රදේශය මාළිගාතැන්න වශයෙනුත් රජු ස්නානය කළ ස්ථානය කපුරු ඇල්ල නමිනුත් ජනප්‍රවාදයේ එයි.

දන්ත ධාතූන් වහන්සේ ලක්දිව වැඩම කිරීමෙන් පසු එය රැගෙන ආ දන්ත කුමරු හා හේමමාලා බිසව කීර්ති ශ්‍රී මේඝවර්ණ රජු විසින් පදිංචි කරනු ලැබුවේ දැදිගම කීරවැල්ලේය.

පොළොන්නරුවේ රජ කළ පළමු පරාක්‍රමබාහු රජුගේ උපන් භූමිය වන්නේද දැදිගමයි. චෝල ආධිපත්‍යයෙන් රට බේරාගත් පොළොන්නරුවේ සිට රජ කළ පළමු විජයබා රජු මිය ගිය පසු රටේ දේශපාලනය අස්ථාවර විය. වැඩිමල් පුතු වික්‍රමබාහු රජ වූ අතර එයට උදව් කළේ විජයබාහු රජුගේ නැගනිය වූ මිත්තාය. ඇගේ පුත් මාණාභරණ යුවරජ බවට පත්විය. අනතුරුව වික්‍රමබාහු මාණාභරණ ඇතුලූ ඔහුගේ සහෝදර පිරිස පලවා හැර පොළොන්නරුවේ සිට රට පාලනය කළහ. අනතුරුව සෙසු රජවරු විවිධ ප්‍රදේශවලට පලා ගිය අතර මාණාභරණ දක්ෂිණ ප්‍රදේශය පාලනය කළේය. මාණාභරණ සිය කුඩා රාජ්‍යය පිහිටුවා ගත්තේ දැදිගමය. මාණාභරණ විවාහ වන්නේ විජයබාහු රජුගේ කාලිංග නම් බිසවගේ ලීලාවතී නම් දියණියට උපන් රත්නාවලී නම් දියණියයි. මේ දෙදෙනාට බිහිවූ පුත් කුමරා වූයේ මහා පරාක්‍රමබාහු රජුයි. පළමුව මෙම ප්‍රදේශයේ සිටි රජු මෙම ප්‍රදේශය දියුණු කළ අතර අනතුරුව ක්‍රි.ව 1153 දී පොළොන්නරුවට පැමිණ ලංකවේ අගරජු බවට අභිෂේක ලැබීය. එම මහා පරාකමබාහු රජු නමින් උපන් ප්‍රදේශය සිහි ගැන්වීම සඳහා සූතිඝර චෛත්‍යය ඉදි කළේය. අද එය අපි කොටවෙහෙර නමින් හඳුන්වයි. මේ පරාක්‍රමබාහු රජු උපන් ස්ථානයයි.

**දන්ත ධාතූන් වහන්සේ ලක්දිව වැඩම කිරීමෙන් පසු එය රැගෙන ආ දන්ත කුමරු හා හේමමාලා බිසව කීර්ති ශ්‍රී මේඝවර්ණ රජු විසින් පදිංචි කරනු ලැබුවේ දැදිගම කීරවැල්ලේය. පොළොන්නරුවේ රජ කළ පළමු පරාක්‍රමබාහු රජුගේ උපන් භූමිය වන්නේද දැදිගමයි.**



ක්‍රි.ව. 1344-1539 අතර කාලයේ පස්වැනි පරාක්‍රමබාහු රජු හෙවත් සවුළු පැරැකුම් රජු දැදිගම අගනුවර කර ගනිමින් රාජ්‍ය පාලනය කළේය. දැදිගම ගතාරා පිරිවෙණෙහි වැඩ විසූ උපතිස්ස හිමියන් මුත්තමාලා නම් පාලි සංදේශය ලේඛන ගත කළේ මේ යුගයේදී එම රජු හා ඇමති මණ්ඩලය




ආරක්ෂා කරන ලෙස ඉල්ලා විභීෂණ දෙවියන්ටය.

මොහු දැදිගම පාලනය කරන විට රයිගම අලකේෂ්වර හා උතුර ආර්ය චක්‍රවර්ති පාලනය කරයි. පැරැකුම් රජුගෙන් පසු දැදිගම වල් බිහිවිය.

අද වන විට මෙම ප්‍රදේශයේ දක්නට ලැබෙන්නේ සීමා සහිත නටබුන් සමූහයකි. ඒ අතරින් කොටවෙහෙර හෙවත් සූතිඝර චෛත්‍යය ප්‍රධානය. 1947 දී මෙහි කැණීම් සිදුවිය. වාසනාවකට මෙම දාගැබ නිදන් සොරුන්ගෙන් විනාශ වී නොතිබුණි. මෙහි ධාතු ගර්භ 10ක් තිබේ. මෙහිදී හමුවූ පුරා වස්තු රැසක් දැදිගම කෞතුකාගාරයේ තැන්පත් කොට ඇත.

මැණික් ගිල්ලවූ ධාතු කරඬුව ලෝකඩ පහන් ලෝකඩ ඇත් පහන් බුද්ධ ප්‍රතිමා පළිගු කරඬු රන් කරඬු පුරාණ කාසි 12 වන ශත වර්ෂයට අයත් අක්ෂර ඒ අතර විශේෂයි. මෙහි ඇති පුරා වස්තු අතර ඇත් පහණ විශේෂයි. එය වර්තමාන භෞතික විද්‍යාවේ ඓතිහාසික පිළිබිඹුවකි.

මෙම චෛත්‍යයේ විශේෂත්වය කොත්කැරැල්ල නොමැති දාගැබ් විශේෂයට අයත් කොට වෙහෙර සම්ප්‍රදායයි. තුන් මහල් පේෂා වළලු මත ධාතු ගර්භය පිහිටා ඇත. මහා දාගැබේ ගර්භයේ කුඩා චෛත්‍යයක් පිහිටුවා ඇත කුඩා දාගැබේ පාදයේ විෂ්කම්භය අඩි 26කි.

ශ්‍රී ලංකාවේ ඉමහත් ප්‍රසිද්ධියක් ජනාදරයක් දිනූ මහා පරාක්‍රමබාහු රජුගේ උපන් භූමිය දැදිගම කොටවෙහෙර බව පුරා විද්‍යාත්මකවත් ඉතිහාස තොරතුරු මතත් ලාංකීය බුද්ධිමතුන් විසින් තහවුරු කර ඇත. අද ද අපේ දේශපාලකයන් ජනතාව ඇන්දවීම සඳහා කියන්නේ පරාක්‍රමබාහු යුගයකට රට ගෙන යන බවයි එම යුගයේ රට සුබිත මුදිත වී ආහාර බහුලව තිබූ යුගයක් පමණක් නොව රජු විදේශ ආක්‍රමණද පළවා හැරියහ. කොළඹ සිට නුවර යන්නෙකුට සුලූ කාලයක් වෙන් කොට මෙම ඓතිහාසික ස්ථානය දැක බලාගෙන යා හැක. එය දැක බලා අප රටේ ඓතිහාසික වීරයන් පිළිබඳව යම් වැටහීමක් ලබා ගැනීමටත් රට පිළිබඳව ගෞරවනීය හැඟීමක් ඇතිකර ගැනීමටත් මෙම ස්ථානය කදිම තෝතැන්නකි.

# CEYLON SHIPPING LINES LTD

**SPECIAL RATES ON COURIER PACKAGES**




Ceylon Shipping Lines LTD
No. 450, D. R. Wijewardena
Mawatha,
Colombo 10.
Tel : 011 - 2689500 - 8

Call us now for the attractive rates,
M :- 0772672970
0773572835
0773561210
E :- csltravels@sltnet.lk






# භාණ්ඩ ප්‍රවාහනයේ දැවැන්තයා සිලෝන් ෂිපිං ලයින්ස්









ශ්‍රී ලංකාව තුළ සේවාවන් රැසක් සිදුකරන විශාලම ව්‍යාපාරික සමාගමක් වන සිලෝන් ෂිපිං ලයින්ස් ආයතනයේ විවිධ වූ සේවාවන් අතරින් භාණ්ඩ ප්‍රවාහනයද ප්‍රධාන අංගයකි. කොළඹ, මරදාන, ඩී. ආර් විජේවර්ධන මාවතේ, අංක 50 හි හෙවත් මරදානේ ප්‍රසිද්ධ “ගාමිණී හෝල් හංදිය” ඉදිරිපිට ප්‍රධාන කාර්යාලය පිහිටා ඇත.

ලොව ඕනෑම රටක සිටින අයෙකුට හෝ ආයතනයකට ලංකාවේ සිටින ඔබ සතු යම් භාණ්ඩයක් නියමිත පරිදි නියමිත වේලාවට පූර්ණ ආරක්ෂාව යටතේ යැවීමට අවශ්‍ය නම් ඒ සඳහා සුදුසුම ආයතනය සිලෝන් ෂිපිං ලයින්ස් හි නාවික දෙපාර්තමේන්තුවයි.

ඕනෑම ප්‍රමාණයක භාණ්ඩ මෙම සේවාව හරහා විදෙස් රටවලට ප්‍රවාහනය කරගත හැක. මේ සඳහා ක්‍රම තුනක් අනුගමනය කරයි.

* **නැව් මගින් අදාල රටට යැවීම**
* **ගුවන් මගින් ආදාල රටට යැවීම**
* **ගුවන් මගින් යවා අදාල රටේ අදාල ආයතනයට හෝ පුද්ගලයාට හෝ බාර දීම**

මේ සඳහා සිලෝන් ෂිපිං ලයින්ස් නාවික අංශයේ විශේෂඥ දැනුම ඇති නිලධාරීන් සිටිති. ඔබේ අවශ්‍යතාව ඔබගේ භාණ්ඩ වල ස්වභාවය ඔවුන්ට ප්‍රකාශ කිරීමෙන් ඔවුන් භාණ්ඩ ප්‍රවාහනය සිදුකළ යුතු ආකාරය පිළිබඳ පැහැදිලි විස්තරයක් ලබා දෙනු ඇත. ඒ අනුව ඔබට කළ යුත්තේ කුමක් දැයි තීරණය කළ හැකි වනු ඇත.

ඊට අමතරව කන්ටේනර් බහාලුම් අපනයනය කිරීමද භාරග නු ලබයි. ලංකාවෙන් විදේශ රටක සිටින ඔබගේ ඥාතියෙකු හිතවතෙකුට එසේත් නැතිනම් යම් ආයතනයකට යැවීමට අවශ්‍ය ඕනෑම ප්‍රමාණයක භාණ්ඩ ප්‍රවාහනය සඳහා ඇනවුම් බාර ගනු ඇත.

මීට අමතරව වෙනත් රටක සිටින ඔබගේ ඥාති හිතවතෙකුට හෝ ආයතනයකට ඉතා ඉක්මනින් ලබා දීමට අවශ්‍ය ලිපි ලේඛන එසේත් නැතිනම් තෑගි භාණ්ඩ ආදී ඕනෑම ද්‍රව්‍යයක් කුරියර් සේවාවන් හරහා අදාල පුද්ගලයාට හෝ ආයතනයට ලබා දීමේ හැකියාවද සිලෝන් ෂිපිං ලයින්ස් නාවික අංශය සතුව ඇත.

එමගින් සිදුකරන තවත් සේවාවක් නම් ලංකාවේ වරායට හෝ ගුවන් තොටුපලට හෝ රේගුව බාරයට ආ භාණ්ඩ ඇතිනම් ඊට අවශ්‍ය නෛතික ක්‍රියා පිළිවෙල අනුගමනය කරමින් අදාල ආයතනයට හෝ පුද්ගලයාට නිදහස් කර අදාළ ස්ථානයට ප්‍රවාහනය කරදීමේ ඉහළම පහසුකම් වලින් සමන්විත ආයතනයකි.

ඊට අමතරව ආනයන අපනයන කටයුතු සඳහා අවශ්‍ය කරන සියලුම ප්‍රවාහන පහසුකම් වලින් කිසිඳු අඩුවක් නොමැති ආයතනයක් වන සිලෝන් ෂිපිං ලයින්ස් නාවික අංශය ඔබට අවශ්‍ය සියලුම විශේෂඥ දැනුම ද ලබා දෙනු ඇත.

සිලෝන් ෂිපිං ලයින්ස් නාවික අංශය විසින් මෙම සේවාවට අමතරව නාවික

**භාණ්ඩ ආනයනයේදීත් අපනයේදීත් ඇතුළු සියලු නාවික කටයුතු වලදී ඒවායේ ආරක්ෂාව හා විශ්වාසය පූර්ණ වශයෙන් රැකගන සිය සේවාවන් ඉටුකරනු ලබයි.**

ඒජන්තවරුන් වශයෙන්ද කටයුතු කරන අතර නැව් සඳහා අවශ්‍ය සේවා පහසුකම් සැපයීමද සිදු කරයි.

ඒ අනුව නාවික ක්ෂේත්‍රයේ නියැලී සිටින ජාත්‍යන්තර නැව් සඳහා ද ලංකාවේ වරායවල් වල නැංගුරම් ලා ඇති නැව් සඳහා ද අවශ්‍ය කරන පානීය ජලය, ආහාරපාන, බෙහෙත් හේත් ඇතුළු එම නැව් වලට අවශ්‍ය සියලු පහසුකම් සපයා දීම සිදු කරයි. ඒ සඳහා නියෝජිත ආයතනයකි.

මෙම සියලු සේවාවන් එක් තැනකින් සිදු වන ආයතන ඇත්තේ ඉතා ස්වල්පයකි. එවැනි ආයතන අතරින් සිලෝන් ෂිපිං නාවික අංශය ඉදිරියෙන්ම සිටින ප්‍රමුඛ පෙළේ ආයතනයක් වෙයි.

භාණ්ඩ ආනයනයේදීත් අපනයේදීත් ඇතුළු සියලු නාවික කටයුතු වලදී ඒවායේ ආරක්ෂාව හා විශ්වාසය පූර්ණ වශයෙන් රැකගන සිය සේවාවන් ඉටුකරනු ලබයි.

ඔබ සතු භාණ්ඩ විදේශ රටක සිටින ඔබගේ ඥාති මිත්‍රයෙකුට හෝ එම රටක ආයතනයකට හෝ භාණ්ඩ වශයෙන් හෝ ලිපි ලේඛන වශයෙන් හෝ යැවීමට ඇත්නම් ඒ සඳහා විශ්වාසනීය ආයතනයක් වශයෙන් සිලෝන් ෂිපිං ලයින්ස් නාවික දෙපාර්තමේන්තුව හඳුන්වා දිය හැක. ඔබගේ සියලු භාණ්ඩ සඳහා රැකවරණයද සහතික වනු ඇත.

ඉතාම ලාභදායී තරගකාරී මිල ගනන් යටතේ අවම මිලකින් ඉක්මන් සේවවක් සපයා ගැනීමට ඔබට හැකි වනු ඇත.

**විදේශ රටකට යැවීමට ලොකු කුඩා යම් භාණ්ඩයක් හෝ ලිපි ද්‍රව්‍යයක් හෝ එසේත් නැතිනම් අපනයන භාණ්ඩ හෝ ඇත්නම් ඔබ දුරකථන අංක 0112689500 අංකයට කතාකරන්න. ඔබට අවශ්‍ය සියලුම තොරතුරු ලබාගත හැකිය. ඊට අමතරව 0777224624 අංකයට පූජිත ලියනගේ මහතා අමතන්න.**


Opportunity to send your
Christmas and new Year gifts
to your loved ones
on this Festival Season
By courier'
With in 6-7 days
Special Rates
Till 31/12/2020
to
UK, Australia, France, USA, Italy, Japan
(Special rates opply for over 5kg / 10kg shipments)
Door delivery
Free Boxes for Packing
Attractive rates for over 50kg shipment
For Further information please contact
Pujitha Liyanage on 0777224624
Shipping Department,
Ceylon Shiipping Lines Limited,
450, D.R. Wijewardana Mw,
Colombo 10.
Tel - 0112689500 - 508 Email - cslship@sltnet.lk

# ඒඩ්ස් වලින් අත්මිදෙන්න බැරිද?

සෑම වසරකම දෙසැම්බර් පළමු දිනය ලෝක ඒඩ්ස් දිනය වශයෙන් සලකා ඒඩ්ස් මර්ධනය කිරීමට විවිධ ක්‍රියා මාර්ග විවිධ සංවිධාන විසින් ඇති කරයි. එසේ කළා වුවද ලොව පුරා දිනෙන් දින ඒඩ්ස් වර්ධනය ඉහළ ගොස් ඇත. ලංකාවේ නම් ඒඩ්ස් වර්ධනය ඉහළ ගියත් වර්ධන වේගය අඩුවී ඇත. එහෙත් එය සතුටුවීමට කරුණක් නොවේ සතුටු විය හැක්කේ කිසිදු ලාංකිකයෙකුට ඒඩ්ස් නෑ කියලා දැනගත් දාටය.

ලෝකයේ පළමු වරට ඒඩ්ස් රෝගි යෙකු හමුවන්නේ 1981 වර්ෂයේය. ලංකාවේ ඊට වසර 6 කට පසු රෝගි යෙකු හමුවෙයි. ඒ 1987 වසරේදීය. 2017 වසරේ ලංකාවේ වාර්තා ගත ඒඩ්ස් රෝගීන් ගණන 285 කි. එහෙත් හඳුනා නොගත් තවත් අය සිටිය හැකි බව වෛද්‍යවරුන්ගේ මතයයි. සාමාන්‍යයෙන් සතියකට පහක් හයක් ඒඩ්ස් රෝගීන් හමුවන බව වෛද්‍යවරු පවසයි. මේ අය වයස අවුරුදු 15-49 ත් අතර වෙයි.

ඒඩ්ස් ආසාධිතයින් හා ඒඩ්ස් රෝගීන් යනු දෙවර්ගයකි. ඒඩ්ස් ආසාදිතයින් යනු HIV වෛරසය ශරීරගත වූ පිරිස්ය. එම වෛරසය ශරීර ගත වූ පසු ඔහු හෝ ඇය ඒඩ්ස් රෝගියෙකු වීමට වසර හතක් අටක් වැනි කාලයක් ගත වෙයි.

මේ වන විට ලංකාවේ හඳුනාගත ඇති HIV ආසාදිතයින් සංඛ්‍යාව 3117 ක් වන අතර එයින් 475 ක් පමණ මිය ගොස් ඇත. මේ වන විට ලෝකය පුරා HIV ආසාධිතයින් මිලියන 37 ක් පමණ හඳුනාගෙන ඇත.

මෙම රෝගය වැඩියෙන්ම ගොදුරු වී ඇත්තේ පිරිමි පාර්ශ්වයයි. 2017 වර්ෂය තුළ ලංකාවේ හමුවූ ඒඩ්ස් ආසාදිතයින් සංඛ්‍යාව අතරින් පිරිමි 223 ක් වන විට කාන්තාවන් සිට ඇත්තේ 62 ක් තරම් පිරිසකි.

ලංකාවේ ඒඩ්ස් ආසාදිතයින් වර්ග පහකට වෙන් කර දක්වයි.

1. කාන්තා ලිංගික වෘත්තිකයින් (ගණිකාවන්) සහ ඔවුන්ගේ පාරිභෝගි කයින්ය.
2. සමලිංගික සබඳතා පවත්වන පිරිමින්
3. මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ පිරිස්
4. වෙරළ සංචාරකයින් සමග සිටින ළමුන් හා පිරිමින් (Beach Boy)
5. බන්ධනාගාර ගතවූ පිරිස්

ඉහත ක්ෂේත්‍ර ඇසුරු කරන පිරිස් ඒඩ්ස් රෝග යේ ප්‍රධාන වාහකයන් බවට පත්වේ. දැනට ඒඩ්ස් රෝගයට ගොදුරු වී ඇති බහුතරය මේ ක්ෂේත්‍ර වල කටයුතු කරන අය වෙති. දිනෙන් දින මේ ක්ෂේත්‍රවලට අවතීර්ණ වන පිරිස් ද ඉහළය. රටේ ගණිකා වෘත්තියේ යෙදෙන පිරිස වාර්ෂිකව වැඩිවෙයි. ඒ අනුව ඔවුන්ගේ පාරිභෝගික සංඛ්‍යාවද වැඩි වනු ඇත. දැන් වන විට සමලිංගික සේවනය පෙරට වඩා ජනප්‍රිය මට්ටමින් සමාජය වෙලා ගෙන ඇත.

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වන පිරිස්ද සංචාරකයින් සමග වෙරළේ ගැවසෙන පිරිස් බන්ධනාගාර ගත වන්නන් ද දිනෙන් දින වැඩිවෙයි. ඒ අනුව පැහැදිලි වන්නේ ඒඩ්ස් වැළඳීමේ බෝවීමේ සීඝ්‍රතාව වැඩිවන බවයි. ඒඩ්ස් මර්ධන ක්‍රියාවලින් තුළදී අනෙකුත් පාර්ශ්වයන් විසින් ඒ ඒ ක්ෂේත්‍රවලට ජනතාව යොමු වීමේ ප්‍රවනතාද අඩුකර ගත යුතුය.

මේ පිරිස් අතරින් සමලිංගික සේවනයේ යෙදෙන අය අතර ඒඩ්ස් රෝගය පැතිරීමේ සීඝ්‍රතාව ඉතා ඉහල බව වෛද්‍ය මතයයි. ලංකාවෙම සිටින



ඒඩ්ස් රෝගීන් ගෙන් 60% ක් සිටින්නේ බස්නාහිර පළාතේය. එයින් බහුතරය සමලිංගිකයින්ය. ලෝක තත්ත්වයත් මෙසේය. පිරිමි සමලිංගිකයින්ට මෙම රෝගය බෝ වීමේ ප්‍රවනතාව ඉතාමත්ම වැඩිය.

**ඒඩ්ස් ආසාධිතයින් හා ඒඩ්ස් රෝගීන් යනු දෙවර්ගයකි. ඒඩ්ස් ආසාදිතයින් යනු HIV වෛරසය ශරීරගත වූ පිරිස්ය. එම වෛරසය ශරීර ගත වූ පසු ඔහු හෝ ඇය ඒඩ්ස් රෝගියෙකු වීමට වසර හතක් අටක් වැනි කාලයක් ගත වෙයි.**

මෙම රෝගයට මෙතෙක් බෙහෙතක් සොයා ගෙන නැත. මෙම රෝගය සුළඟි න් ජලයෙන් මදුරුවන්ගෙන් බෝ වන්නේ නැත. මෙය බෝවන ප්‍රධානතම කාරනා වන්නේ අනාරක්ෂිත ලිංගි ක හැසිරීමත් අනාරක්ෂිත එන්නත් කටු භාවිතයත් රෝගියෙකුගෙන් ලබාග න්නා රුධිරය ලබා දීමෙනුත් පමණි. නමුත් එම අවස්ථා ඉතාමත්ම අඩුය. වැඩිපුරම වාර්තා වන්නේ අනාරක්ෂිත ලිංගි ක හැසිරීමයි.

ලොව සෑම රටකම සිදුවන්නේ මෙම රෝග සුව කිරීම නොව බෝවීම පාලනය කිරීමයි. සුවකළ නොහැකි රෝගයක් බවට පත්ව ඇත්තේ තාමත් ඒ සඳහා ප්‍රතිකාරයක් ලෝකයේ කොතනකවත් සොයාගන නොමැති බැවිනි. රෝග පාලනය අතින් ලංකාව ඉදිරියෙන් සිටින රටකි.

ලිංගාශ්‍රිත රෝග මර්ධන ඒකකය පවසන්නේ ලංකාවේ ඒඩ්ස් රෝගී න් 4000 ට අධික පිරිසක් සිටිය හැකි බවයි. එහෙත් ඔවුන් විවිධ සමාජමය කරුණු හේතුවෙන් සැඟවී සිටිනවා. එය භයානක තත්වයක්. කළ යුත්තේ තමාට තමා ගැන යම් සැකයක් ඇති වුණොත් වහාම ලඟම පිහිටි රජයේ රෝහලකට ගොස් රුධිරය පරීක්ෂා කර ගැනීමයි.

ලිංගාශ්‍රිත රෝග මර්ධන ඒකකය මගින් නගරවල සිටින ලිංගික වෘත්තිකයින් දැනුවත් කිරීම ආරක්ෂිත උපකරණ බෙදාහැරීම ආදී වැඩ පිළිවලවල් දිගින් දිගටම සිදුකරමින් මෙය වැළැක්වීමේ මාර්ග ක්‍රියාත්මක කරනු ලැබීමයි.

හැමෝම මෙම රෝග යේ භයානක කම වටහා ගනිමින් ආරක්ෂා වීමත් සමාජමය වගකීමක් යැයි සිතා සමාජයට රු කවරණයක් ලබා දෙමින් තමනුත් ආරක්ෂා වන්නේ නම් මෙයින් අත්මිදිය හැකි වීමෙන් මෙය ලොවින්ම වුවද තුරන් කළ හැක.

බුදු දහමට අනුව නම් මේ සඳහා ඇති එකම හා ස්ථිර විසඳුම වැරදි කාම සේවනය අත හැරීමයි. පළමුවෙන් සමාජය එම ශිල්පදය ආරක්ෂා කරන්නේ නම් රෝගය වැළඳීමත් බෝවීමත් දෙකම නවතිනු ඇත. එහෙත් හැඟීම් වලට සිත වහල් වන අවස්ථාවලදී ඒ ගැන හැඟීමක් නො එනු ඇත. චිත්ත දමනය ඒ සඳහා අවශ්‍යය. ඒ සඳහා දැඩි සිතක් අවශ්‍යය.

**ලෝකයේ පළමු වරට ඒඩ්ස් රෝගි යෙකු හමුවන්නේ 1981 වර්ෂයේය. ලංකාවේ ඊට වසර 6 කට පසු රෝගි යෙකු හමුවෙයි. ඒ 1987 වසරේදීය. 2017 වසරේ ලංකාවේ වාර්තා ගත ඒඩ්ස් රෝගීන් ගණන 285 කි. එහෙත් හඳුනා නොගත් තවත් අය සිටිය හැකි බව වෛද්‍යවරුන්ගේ මතයයි.**

පළමුව තමාට තමා ගැන සැකයක් ඇත්නම් රෝග පරීක්ෂාවකට යොමුවීම පළමු විසඳුමයි. දෙවනුව කළ යුත්තේ වැළදී ඇත්නම් තව කෙනෙකුට බෝ වීමට ඉඩ නොහැර කටයුතු කිරීමත් බෝ වී නැත්නම් බෝ නොවී සිටීමට වග බලා ගැනීමත්ය.

අද ලෝකයටම අභියෝගයක් වී ඇති මෙම මාරාන්තික රෝගය අපේ වැරදි නිසා අපට වැළදී ඇති නිසා මෙය වෙනස් කළ හැක්කේද අපිටමය.

# ATTRACTIVE AIR FARES TO MIDDLE EAST & OTHER COUNTRIES

## Sri Lankan Airlines Schedules

| Flight Number | Destination | Daye of Operation |
|---|---|---|
| UL 225 | Dubai | Tuesday / Saturday |
| UL 217 | Doha | Monday / Friday |
| UL 503 | London | 7 days of the week |
| UL 606 | Sydney | Wednesday / Friday |

## Emirates Airways Schedules

| Flight Number | Destination | Daye of Operation |
|---|---|---|
| EK 649 | Dubai | Wednesday / Friday / Saturday / Sunday |

## Qatar Airways Schedules

| Flight Number | Destination | Daye of Operation |
|---|---|---|
| QR 669 | Doha | 7 days of the week |

## Oman Airways Schedules

| Flight Number | Destination | Daye of Operation |
|---|---|---|
| WY 372 | Muscat | Thursdays |

*Call For further details,*

**Ceylon Shipping Lines Travels**
**450, D.R. Wijewardena Mawatha,**
**Colombo 10**
**011 - 2689500 - 8**

**M : 077-2672970**
**077-3572835**
**077-3561210**
**E : csltravels@sltnet.lk**

# අලි මිනිස් ගැටුම

තුරු මැද ඉපිද ඇතුන ද සතුන ද රඟති
සොබා ලඳ පැලඳ රුව ලද කිරුළද එවෙති
අහර ද දියද රස විඳ ලොබ බැඳ ඉමැති
වන බඳ ගමද ගම බද වනය ද ගැටෙති

ගිජු සිත් සවස් වන කල ගම වෙත නෙතැර
ගොවි අත් සකස් කල පල සැම වෙත ගොදුර
වනයත් නිවෙස් ඉදිකල ඉම මත නිතර
අලි ඇති මිනිස් අරගල නිම නැත මිතුර

පැමිණෙති අඳුරේම රැණින් දෙතුන් දෙන
වනසති ගෙන කෑම තලමින් සොඬින් ගෙන
නිම නැති සටනේදී යෙදෙමින් දිනෙන් දින
මිය යති දෙපසේම "සතුරන්" තැනින් තැන

දෙ අතර සටන මැද ඇත් මිනිසත් නමිනි
තොරතුරු මියෙන ලද තෙක් කරවත් නයනී
අනතුර හැඳින රද නෙත් නොඇරෙත් සකිනි
කෙලවර කෙදින කඳ සක් දෙවිඳුත් නොදනී

**විජිත ජයතිලක**

# අත්තම්මාගේ කවිය

පාසල ඇරෙන්නයි සීනුව නද   දෙන්නේ
සේරම ළමයි එකටයි පාරට   පැන්නේ
වාහන පෝලිමට කොහොමද   ලංවෙන්නේ
දරුවා හොයා ගන්නට බැරුවයි   ඉන්නේ

අපි ඒ දවස්වල අඩි පාරෙන්   ආවේ
බෝවිටියා කැලෙයි දවසම ගත   වූයේ
ගමේකමට කවුරුත් හිස අත   ගෑවේ
හොරෙන් ගෙනියතැයි සැක සිත් නැහැ   ආවේ

කැලේ පුරා පළතුරු තිබුණා   එමට
ඉස්කෝලෙට ගෙනාවා සතයට   දෙකට
දැන් කඩ තිබේ වැහි වැහැලා මග   දිගට
ටොපි චොකලට් කකා යති රුපියල්   වලට

හවසට කුඹුරු වල වතුවල දුව   පනිති
සරුංගල් යවති, හිනැහෙති ගහ   ගනිති
විවේකයක් අද ඉස්පාසුවක්   නැති
පන්ති පන්ති මොනවද ඉවරයක්   නැති

**එම්. ඩී. ශිරාණි ගුණතිලක - වාද්දුව**

# "පහේ" දරු වත

හනික යමන් පුංචි පුතේ
එල්ලෙ බලා තරගෙටා
අන්න බලන් පහේ කණුව
නොවැටී යං විගහටා

පුත නොබලන් නුඹ වටපිට
එල්ලය ගං නිසි ලෙසා
සුළඟින් තුරු පත් නැටුවට
මග නොරැදෙන් ඒ ආසා

පිළි බිඳු හිරු රැසින් දිලෙයි
නුඹට පලක් වෙද පුතේ
වඅහඟුන් මග දෙපස ගයයි
අපට මොකෝ මෙය පුතේ

මෙවන් වෙහෙස ගත නිරතුරු
අම්බලමක් හමුවෙන තුරු
ගිමන් නිවනු එහි යට තුරු
එකොළහේ කණුවට යන තුරු

**ජයසේන කොඩිතුවක්කු**
**වත්තල**




# මග බලමින් සිටින්න

හන්තානේ මල් පිපෙන්න තව මල් වැහි වහින්න..
සමනලයිනි පැනි උරන්න පේලි පේලි ගැහෙන්න..
ආදරයට කෝඩුකාර ජෝඩු වලට පෙනෙන්න...
කුරුල්ලනේ අහස පුරා පෙම් කරනම් ගහන්න.

හැන්දෑවට පාට පාට මල් ගවුමම අඳින්න
පාට උලා එපා අනේ රතු කම්මුල් වහන්න
රැලි කෙහෙරැලි හලා ඉන්න මද සුලගේ නටන්න
මං එනතුරු විමසිල්ලෙන් මග බලමින් සිටින්න

පෝයදාට ගැටඹෙට ගොස් මල් පූජා කරන්න
අප එක් වන දිනය ලඟා වෙන්න කියා පතන්න
පොල් ගහලා පේවීලා දෙවි පිහිටක් යදින්න
මං එනතුරු විමසිල්ලෙන් මග බලමින් හඳින්න.

**නිරෝමිනී සකුන්තලා**


Ceylon Shipping Lines Ltd.

- Container Freight Station
- Container Storage, Repair & Haulage
- Container Shifting, Stuffing, De-stuffing
- Weighbridge Facility
- Reefer Monitoring
- BIO Verification Centre






No. 70, Avissavella Road, Wellampitiya.
Tel. +94 - 11 -2043424, +94 - 11 -2572405
Fax. +94 - 11 -2572050
E mail. cslope@sltnet.lk, cslodt@sltnet.lk

Head Office:
No. 450, D.R. Wijewardane Mw, Colombo 10.
Tel. +94-11-2689500 Fax. +94-11-2689510
Web. www.ceylonshippinglines.lk

# දරු උපත හා බැඳුනු සිරිත් විරිත්

**සෑම සත්ව ගහනයකම පැවැත්ම පවතින්නේ සිය පරම්පරාව බෝවීමේ ප්‍රවනතාවය අනුවය. ඈත අතීතයේ සිටි විවිධ වූ සත්ව වර්ග අද වන විට අඩුවෙමින් පවතිනවා පමණක් නොව තවත් සමහර සත්වයින් මේ මිහි තලයෙන්ම තුරන් වී ගොස් ඇත.**

මෙය මානව වර්ග යාටත් පොදු ලක්ෂණයකි. මිනිස් වර්ගයාද සිය පුරපුර බිහි නොකළ හොත් මානව වර්ගයාද පෘථිවි තලයෙන් තුරන් වනු ඇත. අද වන විට සමහර ශිෂ්ටාචාර සහමුලින්ම විනාශ වී ගොස් ඇත. සිංහල ජාතියද මිහිතලයෙන් තුරන් වී යන කාලය ඒ තරම් ඈතක නොවන බව මේ වන විට මැනවින් පසක් වී ඇත.

එහෙත් මීට වසර දහස් ගානක සිට සිංහල වර්ග යා රටට අවශ්‍ය ප්‍රමාණයට බිහිවිය. ඔවුන් නිරෝග ීය. ජව සම්පන්නය. නිර්මාණශීලී මිනිසුන් වූහ. එහෙත් අද වන විට සිංහල වර්ගයා ගෙන් 90% ක්ම රෝගීන්ය. බෙලහීනය. සිය ජව සම්පන්න බවක් ඇත්තේම නැති තරම්ය. බෝවීමේ වේගය සීඝ්‍ර ලෙස පහළට වැටී ඇත.

එසේ වීමට හේතු සාධක බොහෝය. නමුත් අතීත මුතුන් මිත්තන් දරු උපත සම්පතක් ලෙස සිතූහ. ඒ නිසාම ඒ වටා සිදුවන ක්‍රියා දාමය අතිශ්‍ය ප්‍රබලය එය ආධ්‍යාත්මය තුළින් ගොඩ නගන ලද්දක් විය.

යම් කාන්තාවකගේ කුසෙහි දරුවෙකු පිළිසිඳ ගත් බව දැනගත් මොහොතේ සිට එම දරු ගැබ ආරක්ෂා කර ගැනීම උදෙසාත් නිරෝගී දරුවෙකු ගැන පමණක් නොව ගුණ යහපත් ධාර්මික හැදිච්ච දරුවෙකු ලබා ගැනීම සඳහාත් ඒ දෙමාපියන්ද ඔවුන්ගේ දෙමාපියන්ද බොහෝ වෙනසක් දැරූහ.

අතීතයේදී යම් කාන්තාවකට දරුවෙකු පිළිසිඳ ගත් විට එය එම නිවසට පමණක් නොව මුළු ගමටම සුබ මංගල්‍යයක් ලෙස ගම්මු සිතූහ. එම දරුවා වෙනුවෙනුත් එම මව වෙනුවෙනුත් ගමේ කොයි කවුරුත් අවධානය යොමු කරති. ඒ මවට අවශ්‍ය කෑම බීම ගරු සැලකිලි ගමේ පවුලේ කොයි කාගෙනුත් ලැබෙති. අද ඒ තරමට වර්තමාන සමාජය ගනන් ගන්නේ නැත. අඩුම තරමේ දුම්රියේ බස්රියේ අසුනක් ලබා ගැනීම පවා අසීරු කටයුත්තක් බව අපට දැක ගත හැක. ජාතියේ පිරිහීම කොතෙක් ද යන්න සිතා ගැනීමට එයම ප්‍රමාණවත්ය.

දරුවෙකු කුස තුල පිළිසිඳ ගැනීමෙන් අනතුරුව සිදුවන චාරිත්‍ර වාරිත්‍ර සිරිත් විරිත් ආදියට කියන්නේ "ගැබ් පෙළහර" කියාය. දරුවා කුසතුළ සිටින එකල මව්වරු කතාවෙන් පවා ප්‍රවේශම් වූහ. පරුෂ වචන හිස් වචන බොරු කීමෙන් පවා වෙන්ව කටයුතු කළේ කුස තුළ සිටින දරුවාගේ යහපත් පැවැත්මට බාධාවක් වේවි යන විශ්වාසය නිසාය.

දරුවා කුස තුළට පැමිණි පසු ඒ මවගේ දෙමාපියන් විශේෂයෙන් මවට විශාල වැඩ කොටසක් ඇත. ගැබ්බර මව බලා ගැනීමේ වැඩිම වගකීම කරට ගන්නේ ඇගේ මවයි. දෙවියන්ට බාරහාර වෙති. කිරි අම්මලාට බාර වෙති. ගිහියන් හෝ පැවිද්දන් එක්කර පිරිත් සජ් ජායනාවක් පවත්වති. ආරක්ෂා යන්ත්‍රයක් කට්ටඩියෙකු ලවා කරට දමති. කළස් පේ කිරීම යන ශාන්තිකර්මයද කරති. ගේ දොර පිරිසිදුවට තබා ගන්නා නමුත් ගේ දොර පිරිසිදු කිරීමේදී රන් කුඹල් ගෙවල් හූණු බිත්තර පවා විනාශ නොවන ලෙස කටයුතු කිරීමට ඔවුහු ප්‍රවේශම් වූහ.

දරු ප්‍රසූතියට ආසන්න වෙද්දී දරුවාත් මවත් ආරක්ෂා කර දෙන ලෙසටත් දරුවාත් මවත් දෙගොඩ වැටුණු පසු (නිරෝගීව සැපතට පත්වීම) පුද පූජා පවත්වා දෙවියන්ට පිංදී මළගිය ඥාතීන්ට පිං අනුමෝදන් කරන බවට පොරොන්දු වී කහ දියරෙන් සෝදන ලද රිදී කාසියක් පිරිසිදු රෙදි පටියක ගැට ගසා ඇඳේ ගැට ගසා බාර වෙති.

දරු ගැබට මාස 9 යි. සතියක් ගෙවුණ පසු අංගුලිමාල පිරිත ඇතුළුව වරු පිරිත සජ් ජායනා කිරීමේදී අතීත හෙළ සිරිතකි. ඉන් බලාපොරොත්තු වන්නේ දරු ගැබට ආරක්ෂාවත් කරදරයකින් තොරව දරු ප්‍රසූතියත්ය.

නැගෙනහිර පළාතේ මුස්ලිම් ප්‍රජාව අතර සිදුවන තවත් චාරිත්‍රයක් ඇත. එනම් කුළුදුල් දරුවා කුසට ආ බව නැන්දම්මා දැන ගත් පසු ඒ දැන ගත් ආසන්නම සුබ දිනයක ලේලිය ගේ මව වෙත ඒ බව දන්වා යවයි. එවිට මව විසින් පැනිපොල් දමා සකස් කරන "කළුකොත්ත" නම් රස කැවිලි වර්ගය දුවගේ නිවසට රැගෙන එයි. එහි විශේෂත්වයක් ඇත. මෙය ලැවරියා මෙන් තම්බා ගන්නා කළුකොත්ත ඇතුළට තවත් කුඩා කළුකොත්ත එකක් දමා පිළියෙල කිරීමයි. එයින් අදහස් කරන්නේ කුස තුල සිටින දරුවායි. ඉන්පසු නැන්දම්මා අවට ඥාතීන්ව ද ගෙන්වා ප්‍රීති උත්සවයක් පවත්වයි.

මව දරු ප්‍රසූතියට ආසන්න වන විට තිඹිරිගෙය ද සූදානම් වෙයි. පැරැණි බොහෝ නිවෙස් වල තිඹිරි ගෙයක් ඇත.



මෙය කළුවර කාමරය ලෙසින්ද හඳුන්වයි. දරුවා ප්‍රසූත වන්නේ මෙම කාමරයේදීය. දරු ප්‍රසූතියට කලින් මෙහි බිත්ති හා පොළව හැම තැනම තිඹිරි ගෙඩි වල ලාටු ගෑම සිදුවෙයි. මෙගින් විෂ බීජ නාශනය සිදුවෙයි. මෙයට තිඹිරිගෙය යනුවෙන් හඳුන්වන්නේ මේ තිඹිරි ඇතිරීම හේතුවෙනි.

ඊළඟට අවශ්‍ය වන්නේ දායම්මා ගේ සේවයයි. දායම්මා යනු වින්නඹු මාතාවයි. පැරැණි ගම්වල වින්නඹු අම්මාවරු සිටියහ. ගමේ අයෙකුට දරුවෙකු ඉපදෙන විට ඇගේ සේවය අත්‍යා වශ්‍යය. ඇයට ඒ පිළිබඳව විශාල පළ පුරුද්දක් ඇත. ඇය ඒ සඳහා කල්වේලා ඇතුව උණු වතුර භාජනයක් නැවීමට භාජනයක් සබන් සිනිඳු රෙදි කතුරක් ආදිය සපයා ගනී. දරු ප්‍රසූතියට මසකට හමාරකට කලින් කොළපත් දෙපස බැඳ සාදාගන්නා ගොටු දූමේ හෝ අටුවේ එල්ලා තබයි. ඒ දරුවා නැවීමටය.

මවට විළිරුදා හැදුන විට වින්නඹු අම්මා කැඳවයි. ඇය වහා පැමිණෙයි. බැබිල හීන් කොටුකොළ පොල්පලා සුදුලූනු එක පමණ දමා තම්බා මවට බීමට දෙයි. සාමාන්‍ය වේදනාවක් නම් වේදනාව පහව යයි. දරුවා ප්‍රසූත වීම සඳහා සෑදෙන විළිරුදාව නම් වේදනාව වැඩිවෙයි.

වේදනාව වැඩි වුණොත් දායම්මා අංගුලිමාල පිරිත සජ්ජායනා කරමින් ඇගේ උදරයේ තලතෙල් ගා පිරිමදියි. විළිරුදාව වැඩි වෙන විට විවිධ මන්ත්‍ර ගුරුකම් කෙම් ක්‍රම ඔවුහු භාවිත කරති.. හවරියක් මවගේ කටට දැමීම මුහුණේ දැවටීම ආදිය සිදු කරයි. පොල්කටු වංගෙ ඩියට දමා කෙටීම තවත් කෙම් ක්‍රමයකි. දරු උපත සිදුවීමට ආසන්න වෙද්දී ගෙදර දොර ජනෙල් පෙට්ටි පෙට්ටගම් ආදිය සියල්ල ඇර තබයි.

**සම්බුද්ධෙ අට්ඨ විසඤ්ච**
**ද්වාදසඤ්ච සහස්සකෝ**
**පඤ්චසත සහස්සාහි**
**නමාමි සිරසාදරං**
**තේසං ධම්මඤ්ච සංඝඤ්ච**
**ආදරේන නමාම්‍යහං**
**නමක්කාරානු භාවේන**
**සබ්බේ හයා උපද්දවා**
**අනේකා අන්තරායාපි**
**විනස්සන්තු අසේ සතෝ**

මේ ආරක්ෂක ගාථාවකි. පංචශීලය ආරක්ෂා කොට ජල බඳුනකට කහ තලා දමා තුන් නූලක් එක්කර මෙම ගාථාවෙන් 108 වරක් ද කරණීය මෙත්ත සූත්‍රය 54 වතාවක්ද කියා ගැබිනි මව්වරුන්ට දීමෙන් දරු ප්‍රසූතිය පහසු වෙනු ඇත.

මේ අපේ ජනප්‍රවාදයට එකතු වී ඇති පුරාණ සිරිත් විරිත්ය. මේවා පත පොතේ ලිය වෙන්නේ දැන්ය. එහෙත් අතීතයේදී කොයි කවුරුත් සිය ජීවන පැවැත්මේ අංගෙ ෘපාංග වශයෙන් භාවිතයෙන් හා අසා දැන ගැනීමෙන් දැන සිටි දේවල්ය.



# ආකර්ශණීය මුදලකට ගුවන් ටිකට්පත් මිලදී ගත හැක.

ඩුබායි කටාර් කුවේට් ඕමාන්

සවුදි ලන්ඩන් පැරිස් කැනඩා

ඕස්ට්‍රේලියා මාලදිවයින ඉතාලි ජපානය

ඇතුළු ලොව ඕනෑම රටකට ගමන් කිරීම සඳහා...

## වැඩි විස්තර සඳහා අමතන්න...

සීමිත සිලෝන් ෂිපිං ලයින්ස් සමාගම,
450, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.
දුරකථන : 011-2689500-8

M - 077-2672970
077-3572835
077-3561210
E - csltravels@sltnet.lk

CSL TRAVELS

IATA ACCREDITED AGENT

# සීමිත සිලෝන් ෂිපිං ලයින්ස් සමාගම
# சிலோன் ஷிப்பிங் லைன்ஸ் லிமிட்டட்
# Ceylon Shipping Lines Ltd

## ඔබේ භාණ්ඩ මව් රට ගෙන ඒමට ලොව පුරා සිටින අපගේ නියෝජිත මහතුන් හමුවන්න.

### ඕස්ට්‍රේලියාව/அவுஸ்திரேலியா/Australia

සී. එස්. එල්. ඕස්ට්‍රේලියා
சி. எஸ். எல். அவுஸ்திரேலியா
**C. S. L. Australia**
10/2, Dingley Ave Dandenong,
Victoria 3175, Australia.
✆ +61397929877/0061 396023966
🖷 +61397924655
✉ cargo@skyway.com.au/www.skyway.com.av

### ජපානය / ஜப்பான் / Japan

ජූරියා ඉන්ටර්නැෂනල්
ஜுரியா இன்டர்நெஷனல்
**Juria International**
✆ +81283205383
🖷 +81283205384
Mobile - 0081-(90) 31027600
✉ tea@cronos.ocn.ne.jp
tcperera@ymail.com / csl@juriaweb.com

### සිංගප්පූරුව / சிங்கப்பூர் / Singapore

එම් ඇන්ඩ් එස් එක්ස්ප්‍රස් කාර්ගෝ ලොජිස්ටික්ස්
எம் என்ட் எஸ் எக்ஸ்பிரஸ் கார்கோ லொஜிஸ்டிக் (பிரை)லிமிட்.
**M & S Express Cargo Logistics Pte. Ltd.**
No. 23, Daihousie Lane, Singapore - 209688
✆ +6563966614 / +6563966615
🖷 +6563966621
✉ sales@ms5.com.sg / mifras@ms5.com.sg

### දෝහා - කටාර් / தோஹா - கட்டார் Doha - Qatar

ලාන්ස් ග්ලෝබල් ලොජිස්ටික්ස්
லான்ஸ் க்ளோபல் லொஜிஸ்டிக்ஸ்
**Lans Global Logistics**
PO Box - 31534, Al - Corniche Tower
Doha - Qatar.
✆ +974 40 414141
🖷 +974 40 414199
Mobile +974 40 414141 / 077 3601554
✉ cmb@lanslogistics.com

ගල්ෆ් ෆැල්කන් සර්විසස් කම්පනි (W.L.L.)
கல்வ் வெல்கன் செர்வீசஸ் கம்பனி
**Gulf Falcon Services Company (W.L.L.)**
PO Box - 7079, Doha - Qatar.
✆ +974 44869723
🖷 +974 77885503 / +974 77883866
✉ gulffalconcargoqatar@gmail.com

### මැලේසියාව / மலேசியா / Malaysia

ජයලංකා / ஜயலங்கா
**Jayalanka (M) SDN BHD**
No. 32 - 2 Jalan
14/48 A, Sentul Raya 51000
Kualalampur, Malaysia
✆ 603-40421896 / +966 539222031
00966 532480407
✉ jay_langka@yahoo.com

### කුවේට් / குவைத் / Kuwait

ෆැල්කන් කාගෝ / பெல்கன் கார்கோ
**Falcon Cargo**
2952, Safat 13154, Kuwait
✆ 0096522419095, 0096522457315
🖷 0096522419098
✉ falconcargo@hotmail.com
falcon_cargo@hotmail.com

යුනයිටඩ් එක්ස්ප්‍රස් ලොජිස්ටික්
யுனைட்டட் எக்ஸ்பிரஸ் லொஜிஸ்டிக்
**United Express Logistic**
Office No 26, Qasariya Blg - 2,
Fahaheel, Kuwait
✆ +9652495858/+9652470862/+96522495898
✉ info@unitedexpresslogistics.com

### ඩුබායි යූ ඒ ඊ / டுபாய் யு. ஏ. ஈ. / Dubai U A E

එම්බසි ෂිපිං ඇන්ඩ් ෆ්‍රේට් එල් එල් සී
எம்பசி ஷிப்பிங் என்ட் பிரைட் எல். எல். சீ
**Embassy Shipping & Frieght LLC**
P.O. Box. 32863, Al Aweer, Dubai, UAE.
✆ Toll Free - 800 37 30
Hot Line - 055 244 99 66
Tel: +971 4 320 70 70
🖷 Fax: +971 4 320 71 71
✉ info@embassyshipping.com
www.embassyshipping.com

නිර්මාන කාගෝ ඇන්ඩ් ලොජිස්ටික් සර්විස් / நிர்மான கார்கோ / **Nirmana Cargo and Logistic Service**
PO Box 87556, Dubai, U.A.E.
✆ +971 556000826

හිරු කාගෝ / இரு கார்கோ / **Hiru Cargo**
PO Box 15946,
Dubai
✆ +971 42895750
✉ hirumooncargo@gmail.com

මදර්ලයින් ෂිපිං / மதர்லயின் ஷிப்பிங் /
**Motherline Shipping**
PO Box 44806,
205 Second Floor,
Zainal Mohebi Plaza Building,
Opp. Centre Point, Dubai
✆ +971 42868791
✉ ravi@motherlines.com

ඕෂන් ලංකා කාගෝ
ஓசியன் லங்கா கார்கோ
**Ocean Lanka Cargo**
P.O. Box - 48843,
Dubai - UAE
✆ 00971-04-2640054
Mobile - 00971-0555 491 987
✉ oceanlankacargolk@gmail.com

ලක්බිම කාගෝ / லக்பிம கார்கோ
**Lakbima Cargo**
P.O. Box - 22675,
Ajman, UAE.
✆ +971 6 7480522

### බහරේන් / பஹறைன் / Bahrain

කලම්බු කාගෝ කම්පැනි
கொழும்பு கார்கோ கொம்பனி
**Colombo Cargo Company**
Bahrain
Block 321, 338, Building No 177
Manama / Alaudayiyah,
Kingdom of Bahrain.
✆ +973 35939343
🖷 +973 17 811707
✉ colombosuppliersbhn@gmail.com

### සවුදි අරාබිය / சவுதி அரேபியா Saudi Arabia

#### Jeddah

වර්ල්ඩ් වයිඩ් ෆ්‍රේට් / வேல்ட் வைட் பிரைட்
**World Wide Freight**
World Wide Link,
(A Div. Of Khalid Nazer Ahames Al Gahathani Trading Est) Jeddah, K.S.A.
✆ 0505657412/0500773931/0543902880
+96626350650/+96626476087/026350650
✉ imthiyaz85360@yahoo.ca

#### දමාම් / Dammam / தமாம்

ඒ බී ටී කාර්ගෝ සර්විස් / ஏ.பி.டி. கார்கோ
**ABT Cargo Services**
✆ +966550952031

#### රියාද් - ரியாத் - Riyadh

ඒ බී ටී කාර්ගෝ සර්විස් / ஏ.பி.டி. கார்கோ
**ABT Cargo Services**
Riyadh Office: +966 112700055
✆ +966555892754
+966532083640
✉ abtcargo2016@gmail.com

ෆේම් කාගෝ / பேம் கார்கோ / **Fame Cargo**
P.O. Box 17958, Riyadh 11494
✆ 2442032/4793845/0508273719
🖷 4793845 / 00966 - 583090555
✉ fameruhcmb@gmail.com

### ලෙබනන් / லெபனான் / Lebanon

ජිහාඩ් රොක්ස් ෂිපිං ඇන්ඩ් ට්‍රේඩිං
ஜிஹாட் ரொக்ஸ் சிப்பிங் அன்ட் ரேடிங்
**Jihad Roukz Shipping & Trading**
JRC, Chbenieh Baadba, Beirut, Lebanon
✆ 00961 - 254733 / 00961 - 3773244
🖷 0096111242677
✉ lanka _cargo@hotmail.com

### ස්විට්සර්ලන්තය / சுவிட்சர்லாந்து Switzerland

එම් සී එස් කාගෝ / எம் சீ எஸ் கார்கோ
**M C S Cargo**
M.T. & T Gmbh, Sperietweg 1, 8052
Zurich, Switzerland.
✆ 0041-796656563 / 0041- 443025838
✉ mcscargo@swissmail.com

### කැනඩාව / கனடா / Canada

සිකැන් ට්‍රාන්ස්කොන්ටිනන්ටල්
சீகேன் ட்ரான்ஸ்கொன்டினன்டல்
**Ceycan Transcontinental**
1981, Boylen Road,
Unit # 5, Mississawga, Ontairo,
L5slR9
✆ +9056739873
🖷 +9056739905
✉ cslcanada2001@gmail.com
ceycantrans@gmail.com

### එංගලන්තය / இங்கிலாந்து United Kingdom

ජේ පී එන් ෂිපිං / ஜே பி என் சிபிங்
**JPN Shipping**
Unit A2c, Redlands
Coulsdon cR5 2HT wk
✆ 02086680252
✉ info@jpnshippingltd.co.uk

මාස් ග්ලෝබල් ෂිපිං
மாஸ் குளோபல் ஷிப்பிங்
**Mass Global Shipping**
✆ 044(0)208 4221232
🖷 208 8644244
✉ info@masshipping.com

ඊසි ෂිපිං ලිමිටඩ් / ஈஸி ஷிப்பிங் லிமிட்டட்
**Easy Shipping Ltd.**
Unit 15, Liongate Enterprise Park
80, Moden Rd, Mitcham cR4 N4
✆ 02086489092 / 07908787627
🖷 info@easyshippingltd.co.uk
www.easyshippingltd.co.uk

ඇට්ලස් ෂිපිං / அட்லஸ் ஷிப்பிங்
**Atlas Shipping**
430, High Road, Willesden,
London. NW 10 2HA
✆ 02084596633 / 0794743535
✉ ajantha.atlasshipping@gmail.com

### ඇමරිකාව /அமெரிக்கா /America

කලම්බු එක්ස්ප්‍රස් / கொழும்பு எக்ஸ்பிரஸ்
**Colombo Express**
1115, Inman Ave, Suite - 323
Edison NJ - 08820
✆ 1888 232 1952
✉ nishan@colomboexpress.com
www.colomboexpress.com

# Ceylon Shipping Lines Ltd









450, D.R. Wijewardena Mawatha,
P.O. Box 891, Colombo 10, Sri Lanka.
Tel: (011) 2689500-508, 2680311-315
Fax: (011) 2689510, 2674347
E-mail: csl123@sltnet.lk
cslmgmt@sltnet.lk
Web: www.ceylonshippinglines.com
Contact: Neranjan - 0777224617

SLSI SYSTEM CERTIFIED ISO 9001

MGMT. SYS. RvA C 155

PATA Pacific Asia Travel Association

IATA

TAASL

***Serving with Excellence***

- Customs Bonded Warehousing
- Unaccompanied Personal Baggage Clearing & Door to Door Home Delivery Covering Major Cities in Sri Lanka Connecting with Worldwide Destinations
- Managing Processing, Shipping Forwarding & Distribution of Imports & Exports
- Airline Ticketing & Travel Agency
- City Central Container Depot Freight Station & Island wide Transportation
- Printing & Publishing

Ceylon Shipping Lines Ltd.